# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயற்றிறன் அறிக்கை

# Annual Performance Report

# 2024

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**

**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

**தேசிய திட்டமிடல் திணைக்களம்**

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

## Department of National Planning
## Ministry of Finance, Planning and Economic Development

**2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**
**වැය ශීර්ෂ අංකය 237**


| | පිටු අංකය |
|---|---|
| **01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/විධායක සාරාංශය** | **3** |
| 1.1. හැඳින්වීම | 3 |
| 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | 3 |
| 1.3. ප්‍රධාන කාර්යයන් | 4 |
| 1.4. සංවිධාන සටහන | 5 |
| 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ | 6 |
| 1.6. දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන/අරමුදල් | 6 |
| 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු (තිබේ නම්) | 6 |
| **02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | **8** |
| 2.1 සමාජීය යටිතල පහසුකම් | 8 |
| 2.2 කෘෂිකර්ම | 10 |
| 2.3 කර්මාන්ත, වෙළෙඳ, ආයෝජන සහ සංචාරක | 15 |
| 2.4 වානිජ යටිතල පහසුකම් | 17 |
| 2.5 පාලනය | 21 |
| 2.6 පරිසර කළමනාකරණය | 22 |
| 2.7 සමාජ ආරක්ෂණ | 24 |
| 2.8 ප්‍රාදේශීය සංවර්ධනය | 26 |
| **03 පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය** | 27 |
| 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 27 |
| 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 28 |
| 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 29 |
| 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් | 29 |
| 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ | 30 |
| 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය | 30 |
| 3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 30 |
| 3.8 මූල්‍ය නොවන වත්කම් භාවිතා කිරීමේ කාර්ය සාධනය | 31 |
| 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව | 31 |

**04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක** **32**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලසුම මත පදනම්ව) 32

**05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** **33**

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 33
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 33

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ** **34**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 34
6.2 ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සහ කාර්ය සාධනය අතර සම්බන්ධතාවය 34
6.3 මානව සම්පත් සංවර්ධනය 34

**07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව** **42**

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/විධායක සාරාංශය

## 1.1 හැඳින්වීම

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව 1956 දී අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වය යටතේ ජාතික සැලසුම් සභාව ලෙස ආරම්භ වූ අතර, රටේ සැලසුම් ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස සැලකිය හැකි මුළු රටම ආවරණය වන පරිදි සකස් කළ සවිස්තරාත්මක ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් ප්‍රථම වරට ඉදිරිපත් කරන ලදී. 1961 දී මෙම සභාව තවදුරටත් ශක්තිමත් කර අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ සැලසුම් දෙපාර්තමේන්තුව ලෙස ස්ථාපනය කරන ලදී. ඒ යටතේ මෙම දෙපාර්තමේන්තුව කෙටිකාලීන සංවර්ධන වැඩසටහනක් සකස් කළ අතර සැලසුම් ක්‍රියාවලිය සඳහා ප්‍රවර්තන සැලසුම් සංකල්පය (rolling plan) ප්‍රථම වරට හඳුන්වා දෙන ලදී. පසුව, දෙපාර්තමේන්තුව 1965 දී සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත කර ප්‍රාග්ධන අයවැය සකස් කිරීම, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම පවරන ලදී. 1974 දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මුදල් හා සැලසුම් අමාත්‍යාංශය යටතට ගෙන එන ලද අතර, එතැන් පටන් එය අනුප්‍රාප්තික රජයන් විසින් වරින් වර මුදල්, සැලසුම් හා ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වගකිව යුතු අමාත්‍යාංශවලට අනුයුක්ත කරන ලදී. වර්තමානයේදී, ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා ලෙස, දෙපාර්තමේන්තුව සිය කාර්යය භාරය මූල්‍ය රෙගුලාසි අංක 3 (2) සහ අංක: 35 මගින් පවරා ඇති අධිකාරියට අනුකූලව සිදු කරනු ලැබේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ජාතියට වඩාත්ම දක්ෂ සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා වීම.

**මෙහෙවර**

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම


**අරමුණු**

1. රාජ්‍ය ආයෝජන කාර්යක්ෂමව භාවිතා කිරීම
2. අදාල රේඛීය අමාත්‍යාංශ සහ ආයතනවල රාජ්‍ය ආයෝජන මගින් සමාජ ආර්ථික ප්‍රතිලාභ උපරිම වන ආකාරයට සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුගතවන පරිදි සකස්කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශකත්වය ලබාදීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ජාතික හා ආංශික ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනයට සහාය වීම
- ජාතික ප්‍රතිපත්ති සමාලෝචනය කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම
- මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන රාමුව සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම
- රාජ්‍ය ආයෝජන සැලැස්මෙහි ව්‍යපෘති ප්‍රමුඛතාකරණය
- මුල්‍යමය සහය සඳහා  සංවර්ධන ව්‍යාපෘති යෝජනා ඇගයීම අනුමැතිය සහ නිර්දේශ සැපයීම
- කැබිනට් සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම
- අවශ්‍ය විටෙක නව සැලසුම් ක්‍රම යොදා ගැනීම
- අවශ්‍ය විටෙක ජාතික, උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීමට පහසුකම් සැපයීම
- විශේෂ/ ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මග පෙන්වීම
- ජාතික සැලසුම් ක්‍රියාවලියට තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රධාන ධාරාවේ යෙදවීම
- විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා සහයවීම
- සංවර්ධන හවුල්කරුවන් සමඟ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමට පහසුකම් සැපයීම
- විශේෂ පැවරුම් සඳහා සහභාගී වීම
- අවශ්‍ය විටෙක කාලීන ගැටළු පිළිබඳ පත්‍රිකා සකස් කිරීම
- සැලසුම් හා අධීක්ෂණයට සම්බන්ධ ජාතික හා ප්‍රාදේශීය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
- කාර්යමණ්ඩලයේ ධාරිතා සංවර්ධනය
- පොදු පරිපාලනය සහ මූල්‍ය

## 1.4 ආයතනික සටහන



## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකරලිම පිණිස දෙපාර්තමේන්තුව අංශ 8 කට වෙන් කර ඇත. එම අංශ 8 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ වලට වෙන් කර ඇත. එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘති යෝජනා ඇගයීම, රාජ්‍ය ආයෝජන ප්‍රතිපත්තිය සැකසීම, ප්‍රතිපත්ති සැකසීම සඳහා රේඛීය අමාත්‍යාංශ වෙත සහයෝගය ලබා දීම සහ අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

මීට අමතරව, සාර්ව ආර්ථික සැලසුම්කරණය, තොරතුරු බෙදා හැරීම සහ දෙපාර්තමේන්තුවේ පරිපාලනය සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම සඳහා වෙනම ආධාරක ඒකක තුනක් ඇත.

1) තොරතුරු සංවර්ධන මධ්‍යස්ථානය
2) පරිපාලන අංශය
3) මූල්‍ය අංශය

**දෙපාර්තමේන්තුවේ අංශ**

- සමාජීය යටිතල පහසුකම්
- කෘෂිකර්ම
- කර්මාන්ත, වෙළෙඳ, ආයෝජන සහ සංචාරක
- වානිජ යටිතල පහසුකම්
- පාලනය
- පරිසර කළමනාකරණ
- සමාජ ආරක්ෂණ
- ප්‍රාදේශීය සංවර්ධන

## 1.6 දෙපාර්තමේන්තුව යටතේ ඇති අරමුදල්

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

(a)

1. ව්‍යාපෘතියේ නම : ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය
2. ආධාර දෙන ආයතනය : ආසියානු සංවර්ධන බැංකුව
3. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන: 74,023* (ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 203.36)
4. ව්‍යාපෘති කාලය : 09.09.2022 – 29.08.2026
   * ව්‍යාපෘති කාලය ආරම්භයේ විනිමය අනුපාතය වන රු. 364 සලකා ඇත.

(b)

1. ව්‍යාපෘතියේ නම : වෙළඳපල සන්ධානය හරහා ස්වයං පාලනය, සාක්ෂරතාවය සහ අවධානය ප්‍රවර්ධනය කිරීමේ (PALAMA) ව්‍යාපෘතිය

2. ආධාර දෙන ආයතනය : ඇමරිකා එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

3. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන: 4535.7

4. ව්‍යාපෘති කාලය : 2019-2024

(c)

1. **ව්‍යාපෘතියේ නම:** වෙළඳපල සන්ධානය හරහා ස්වයං පාලනය, සාක්ෂරතාවය සහ අවධානය ප්‍රවර්ධනය කිරීමේ (PALAMA) ව්‍යාපෘතිය - අදියර II

2. **ආධාර දෙන ආයතනය:** ඇමරිකා එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය** : රු. මිලියන: 10 ,400

4. **ව්‍යාපෘති කාලය:** 2024 - 2028

(d)

1. ව්‍යාපෘතියේ නම: **වෙළෙඳාම , ජාතික වියදම් සහ ආදායම් වල කඩිනම් ප්‍රතිඵල සඳහා හවුල්කාරීත්වය (සහකරු) ව්‍යාපෘතිය**
2. **ආධාර දෙන ආයතනය:** ඇමරිකා එක්සත් ජනපද ආධාර (USAID)
3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය** : රු. මිලියන: 3,058
4. **ව්‍යාපෘති කාලය:** 2019 - 2025

(e)

1 **ව්‍යාපෘතියේ නම: ආර්ථික වර්ධනය සඳහා වන යහපාලන වැඩසටහන**
2. **ආධාර දෙන ආයතනය:** ඕස්ට්‍රේලියානු රජය
3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය** : රු. මිලියන: 11,250
4. **ව්‍යාපෘති කාලය:** 2021 - 2031

(f)

1 **ව්‍යාපෘතියේ නම: ඵලදායී රාජ්‍ය ආයෝජන කළමනාකරණය සඳහා ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය**
2. **ආධාර දෙන ආයතනය:** ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA)
3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය** : රු. මිලියන: 173.7
4. **ව්‍යාපෘති කාලය:** 2021 - 2025 අගෝස්තු

# 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ආංශීය වශයෙන් ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 සමාජීය යටිතල පහසුකම්

### අධ්‍යාපනය

රටක ආර්ථික හා සමාජීය සංවර්ධනය සඳහා මානව සම්පත් සංවර්ධනය අත්‍යවශ්‍ය වේ. අධ්‍යාපනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ පුද්ගල වර්ධනයට සහ සමාජීය දායකත්වය සඳහා අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්පවලින් පුද්ගලයන් සන්නද්ධ කිරීමයි. ප්‍රාථමික හා ද්විතීයික මට්ටම් ඇතුළු සාමාන්‍ය අධ්‍යාපනය, දරුවන්ගේ පෞරුෂ වර්ධනයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකාව තුළ රජයේ පාසල් 10,126 ක්, රජයේ අනුමත ජාත්‍යන්තර පාසල් 90 ක්, පිරිවෙන් පාසල් 816 ක් සහ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා විශේෂ පාසල් 30 ක් ඇත. රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට රාජ්‍ය විශ්වවිද්‍යාල 17 ක්, පාර්ලිමේන්තු පනත් මගින් ස්ථාපිත විශ්වවිද්‍යාල 5ක්, උපාධි සහ පශ්චාත් උපාධි පිරිනමන ආයතන 19 ක් සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 28 ක් ඇතුළත් වේ.

ඒ අනුව 2024 වසරේ අධ්‍යාපන අංශය විසින් ව්‍යාපෘති යෝජනා 33ක් තක්සේරු කර අවශ්‍ය නිර්දේශ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී. තවද, අවබෝධතා ගිවිසුම් (MOUs) 05ක් සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී. එසේම, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් සහ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 24 ක් සඳහා නිරීක්ෂණ සකස් කරන ලදී.

### නිපුණතා අධ්‍යාපනය

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන ආර්ථිකයන්හි තරුණ තරුණියන්ට කාර්මික අංශ සමඟ සම්බන්ධ වී කටයුතු කිරීමට මෙන්ම නිපුණතා හිඩැස පිරවීම සඳහා නිපුණතා ලබා ගැනීමට ද හොඳ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු (TVET) පද්ධතියක් තිබිය යුතුය. ඒ අනුව, රට තුළ ජාතික, ආර්ථික සහ සමාජීය සංවර්ධන ක්‍රියාවලියේදී ඉහළ නිපුණතා සහ නිපුණ ශ්‍රම බලකායක් සිටීමේ වැදගත්කම රජය විසින් හඳුනාගෙන ඇත. ඊට සමගාමීව, ජීවිත කාලය පුරාම ඉගෙනීම ප්‍රවර්ධනය කිරීමත්, අපනයනය ඉලක්ක කරගත් කර්මාන්තවලට සහාය වීමත්, හරිත ආර්ථිකයක් වෙත රට පරිවර්තනය කිරීම සඳහා පහසුකම් සැලසීමත් අරමුණු කර ගනිමින් තරුණ හා වැඩිහිටියන් සඳහා නිපුණතා, ප්‍රති-නිපුණතා සහ ඉහළ නිපුණතා සඳහා වෘත්තීය-තාක්ෂණික සහ ඩිජිටල් කුසලතා වර්ධනය කිරීමටත්, රජය කටයුතු කර ඇත.

### නිම කරන ලද කාර්යයන්

- නිසියාකාරව සාධාරණීය කර ඇති ඇගයීම් වාර්තා 04 ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට/ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට සහ අදාළ රේඛීය ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- නිපුණතා අධ්‍යාපන අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 03ක් සඳහා නිරීක්ෂණ සකස් කිරීම
- නිපුණතා සංවර්ධන අංශයට අදාළව අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය කිරීම.
- විවිධ පාර්ශ්ව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද විවිධ වාර්තා/ලේඛන/සැලසුම් සඳහා අදහස්/නිරීක්ෂණ සකස් කිරීම

### තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

සියල්ලන් ඇතුළත්බව, නව්‍ය සහ තිරසාර සංවර්ධනය, මානව කේන්ද්‍රීය සහ මානව අයිතිවාසිකම් ආදී ඩිජිටල්කරණය තුලින් ශ්‍රී ලංකාව සවිබල ගැන්වීමේ දී , පදනම් වූ මූලධර්මයි. ආර්ථික ක්ෂේත්‍ර ඩිජිටල්කරණය, වේගවත් ආර්ථික ප්‍රකෘතිය(recovery) ට සහාය වනු ඇති අතර, රටේ සංවර්ධන ඉලක්ක කාලෝචිත ලෙස සාක්ෂාත් කර ගැනීම එමගින් සහතික කරනු ඇත. ඒ අනුව, සම්බන්ධතාවය (connectivity) සහ ප්‍රවේශය (access), තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව, රාජ්‍ය කටයුතු ඩිජිටල්කරණය, ආරක්ෂාව, ඩිජිටල් මූල්‍යකරණය සහ ආර්ථික ක්ෂේත්‍ර ඩිජිටල්කරණය වැනි තේමාත්මක ක්ෂේත්‍ර 6ක් හරහා ආර්ථිකය ඩිජිටල් ආර්ථිකයක් කරා පරිවර්තනය කිරීමට රජය අපේක්ෂා කරයි. පෞද්ගලික ආයෝජන හරහා එම ප්‍රයත්නය දිරි ගැන්වෙනු ඇත.

### නිම කරන ලද කාර්යයන්

- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයට අදාළ ව්‍යාපෘති යෝජනා 25 ක් ඇගයීම් කර නිර්දේශ ලබා දෙන ලදී.
- අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 07ක් සඳහා නිරීක්ෂණ සකස් කිරීම
- අදාළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

### විද්‍යාව සහ තාක්ෂණය

පර්යේෂණ සහ සංවර්ධන (R&D), නවෝත්පාදන, තාක්ෂණික දියුණුව ආර්ථිකයන්හි ආර්ථික වර්ධනය බහු ගුණයකින් ඉහළ යාමට හේතු වන ප්‍රධාන පරාමිතීන් වේ. එම පරාමිති මඟින් ශ්‍රම බලකායේ නිපුණතා වැඩි දියුණු කිරීම තුළින් ඔවුන්ගේ ඵලදායිතාව ඉහළ නැංවීමට රටට හැකියාව ලැබේ. තාක්ෂණික නවෝත්පාදනයන්, දැනුම නිර්මාණය කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම ආදිය ආර්ථික පසුබෑම සහ ආර්ථිකයේ අනෙකුත් ගැටළු සඳහා විසඳුම් කරා ළඟා වීමට මාර්ග සහ විධි වේ.

### නිම කරන ලද කාර්යයන්

- විද්‍යාව හා තාක්ෂණය විෂයට අදාළ ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව 3 ක් ඇගයීම් කර නිර්දේශ ලබා දෙන ලදී.
- අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 06ක් සඳහා නිරීක්ෂණ සකස් කිරීම
- අදාළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

### සෞඛ්‍ය අංශය

ප්‍රාථමික සෞඛ්‍ය සේවා භාවිතය වැඩිදියුණු කිරීම, සෞඛ්‍ය සේවාවේ ඩිජිටල්කරණය සහ ඖෂධ සැපයුම් දාමයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම රජයේ සෞඛ්‍ය පද්ධතියේ ප්‍රධාන ප්‍රමුඛතා වේ. 2024 වර්ෂයේදී සෞඛ්‍ය අංශය සඳහා රජයේ ප්‍රධාන අරමුණු වූයේ රටේ මහජන සෞඛ්‍ය සේවාව වඩාත් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සහ රට තුළ ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් ඖෂධ සහ සෞඛ්‍ය උපකරණ හිඟය වැළැක්වීමයි. ඒ අනුව, 2024 වර්ෂයේ දී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සෞඛ්‍ය අමාත්‍යාංශය, අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සම්බන්ධීකරණය කර ක්‍රියාත්මක වෙමින් පැවති සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. තවද, ජාතික සෞඛ්‍ය පද්ධතියට අපේක්ෂිත දායකත්වය ලබා ගැනීම සඳහා 2020 සිට අත්හිටුවා තිබූ ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

**නිම කරන ලද කාර්යයන්**

- ව්‍යාපෘති යෝජනා 14 ඇගයීම් සිදු කර ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත. ඊට අදාල නිරීක්ෂණ අදාළ රේඛීය අමාත්‍යාංශය, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

- සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 04 සඳහා නිරීක්ෂණ සපයා ඇත.

- සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති යෝජනා 02 සඳහා මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් නිරීක්ෂණ සහ යෝජනා සපයා ඇත.

- සෞඛ්‍ය අංශය සඳහා ඉදිරි වර්ෂ තුළ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යෝජනා වී ඇති ව්‍යාපෘති සලකා බලා ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.

- සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාලව ක්‍රියාත්මක වන විදේශ ආධාර සපයන ව්‍යාපෘති වලට අදාලව රැස්වීම් පවත්වා අදාල නිරීක්ෂණ/ ලෝක සෞඛ්‍ය සංවිධානය , ලෝක බැංකුව , ආසියානු සංවර්ධන බැංකුව වැනි මූල්‍ය ආධාර සපයන ආයතන වල නියෝජිතයන් වෙත ඉදිරිපත් කිරීම.

**ක්‍රීඩා අංශය**

- සහභාගීත්වය පෝෂණය කිරීම, සහ සෞඛ්‍ය සම්පන්න, විනයගරුක සහ බුද්ධිමත් සමාජයක් හැඩගැස්වීම සඳහා ක්‍රීඩාව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ජයග්‍රහණ තුළින් ජාතියකට ගෞරවයක් සහ අභිමානයක් ගෙන ඒමෙන් ඔබ්බට, ක්‍රීඩාව විනය, ශක්තිමත් චරිත සහ යහපත් මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් නිර්මාණය කිරීමට දිරිය ලබාදේ. රජයේ සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ජවසම්පන්න පුරවැසියෙකු - ජයග්‍රාහී ජනතාවක් නිර්මාණය කිරීම අරමුණු කරයි. ක්‍රීඩා අංශයේ මූලික අරමුණ වන්නේ දක්ෂ, සෞඛ්‍ය සම්පන්න සහ විනයගරුක පුද්ගලයන් පෝෂණය කරන ක්‍රීඩා සංස්කෘතියක් වර්ධනය කිරීමයි. කුඩා කල සිටම ක්‍රීඩා කිරීමට දරුවන් දිරිමත් කිරීම, ජාත්‍යන්තර තලයට තරඟ කිරීමට සුවිශේෂී දක්ෂතා ඇති අය හඳුනාගෙන පුහුණු කිරීම, ක්‍රීඩා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ක්‍රීඩා උපදේශකයින්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා සම්පත් ලබා දීම මෙයට ඇතුළත් වේ.

- ප්‍රතිපත්ති සම්පාදනය, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම සහ ජාතික/ආංශික සංවර්ධන සැලසුම් ඇගයීම සඳහා සහය දැක්වීම සඳහා ක්‍රීඩා අංශය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. ඒ අනුව ක්‍රීඩා අංශය විසින් ව්‍යාපෘති යෝජනා 19ක් ඇගයීමට ලක් කර අවශ්‍ය නිර්දේශ 2024 වසරේ ඉදිරිපත් කරන ලදී. තවද, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ 04ක් සඳහා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

## 2.2 කෘෂිකර්ම

**කෘෂිකාර්මික අංශය**

රටේ ජනගහනයෙන් හතරෙන් පංගුවකට වඩා වැඩි පිරිසකගේ ප්‍රධානතම ජීවනෝපාය වන කෘෂි අංශය ජාතික හා ගෘහාශ්‍රිත ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාවයට දායක වන අතරම ආර්ථිකයේ අනෙකුත් අංශ සමඟ සිරස් සහ තිරස් ඒකාබද්ධතාවය තුළින් රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනය උදෙසා සැලකිය යුතු දායකත්වයක් දක්වනු ලබයි. රටේ මුළු භූමි ප්‍රමාණයෙන් , ඉඩම් වලින් 40%කට ආසන්න

ප්‍රමාණයක් වගා කිරීමට සුදුසු වන අතර ඉන් 65%ක් (හෙක්ටයාර මිලියන 1.9) කට ආසන්න ප්‍රමාණයක් වගා කෙරේ. වගා කරන භෝග අතරින් වී සහ වැවිලි භෝග (ප්‍රධාන වශයෙන් තේ, රබර් සහ පොල්) වගා කෙරෙන භූමි ප්‍රමාණයෙන් 36%ක් බැගින් වේ. කෘෂි අංශයේ ප්‍රාථමික නිෂ්පාදනය රටේ දළ ජාතික නිෂ්පාදනයෙන් 7.9% ක් (2023) පමණ විය. කෘෂිකාර්මික අංශයේ අපනයන ආදායම රටේ මුළු අපනයන ආදායමෙන් 20% කට ආසන්න වේ. (වාර්ෂික වාර්තාව - CBSL 2023)

කෘෂිකාර්මික අංශයේ වර්ධනය ගෝලීය වශයෙන් ජීවනෝපාය සහ රැකියා උත්පාදනය, අපනයන ආදායම හරහා ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාවය සහ ආර්ථිකය සඳහා ප්‍රමුඛ දායකත්වයක් ලබා දේ. කෘෂි නිෂ්පාදනය භූගෝලීය වශයෙන් සමාන ලෙස පැතිරී නොමැත. මෙහිදී නිෂ්පාදනය පුළුල් කිරීමට, නිෂ්පාදන විශේෂඥතාවයට සහ නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට තීරණාත්මක සාධකයක් ලෙස භූමිය බලපාන අතර ඒ අනුව කෘෂි අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට තාක්ෂණය උපයෝගී කර ගනිමින් කෘෂි අංශය නවීකරණය කිරීම එම අංශයේ කැපී පෙනෙන තිරසාර වර්ධනයක් ඇති කිරීම සඳහා විකල්පයක් බවට පත්ව ඇත.

**ආහාර බෝග කෘෂිකර්මාන්තය**

ආහාර බෝග කෘෂිකර්මාන්තය මගින් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව සහතික කරනු ලැබේ. වසංගත , අයහපත් දේශගුණික තත්ත්වයන් සහ නිෂ්පාදන යෙදවුම්වල මිල ඉහළ යාම හේතුවෙන් සැපයුම් ජාලය කඩාකප්පල් වීම නිසා ඇති වූ ගෝලීය ආහාර අර්බුදයේ බලපෑම මේ වන විට, විවිධ රාජ්‍ය මැදිහත්වීම් සහ කෘෂි අංශයේ සිදු කළ ප්‍රතිසංස්කරණ තුළින් දේශීය ආහාර වෙළඳපොළ වෙත යොමු වීම අවම කර ඇත. ආහාර නිෂ්පාදනය සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ගොවීන්ට / නිෂ්පාදකයන්ට සහන ණය සහ මූල්‍ය දිරිගැන්වීම් ලබා දෙන ලදී. තවද පුද්ගලික අංශය මෙන්ම සහභාගීත්ව වෙළඳපොළ තුළ තරඟකාරීව සිටීමට ආහාර හා අගය දාමයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවමින් අනාගත ව්‍යවසායකයින් සඳහා සහන ණය සහ ගැළපෙන ප්‍රදාන පහසුකම් ද සපයා දීමට කටයුතු කරන ලදී.

**නිම කරන ලද කාර්යයන්.**

- ව්‍යාපෘති යෝජනා 21 ක් ඇගයීම් සිදු කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදි.
- කාෂිකර්ම අංශය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 06 ක් සඳහා අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ සහ තාක්ෂණික අදහස් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී

**විශේෂ කාර්යයන්**

- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීම් ආයතනය (HARTI) විසින් පවත්වන ලද "Workshop On Fruits and Vegetables Processing Industry " සහභාගි වී තාක්ෂණික යෙදවුම් ලබා දීම.
- " Damage to Paddy Crop and Irrigation Infrastructure" පිළිබඳව අධ්‍යයනයක් සිදු කර වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලදී.
- "Food Inflation Forecast "පිළිබඳ වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලදී.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව සහය සටහන (Aide Memoire) සඳහා නිරීක්ෂණ ලබා දීම.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම

**පශු සම්පත් අංශය**

පශු සම්පත් අංශය විශේෂයෙන් රටේ ග්‍රාමීය ප්‍රදේශවල මිලියන 1.6 ක පමණ ජනගහනයකට පෝෂණය සහ ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සඳහා දායක වන ප්‍රධාන උප අංශයකි. දළ දේශීය නිෂ්පාදිතයට 1% කට වඩා අඩු දායකත්වයක් දැක්වුවද, එම ක්ෂේත්‍රය සඳහා වන ශ්‍රම අවශ්‍යතාවය හේතුවෙන්, ග්‍රාමීය රැකියා උත්පාදනය, දරිද්‍රතාවය පිටුදැකීම සහ එමඟින් ආර්ථික සංවර්ධනයට මග පෑදීම සඳහා යොදා ගත හැකි ප්‍රධාන ක්ෂේත්‍ර අතරට එය එක් වේ. මෙම අංශයට ප්‍රධාන වශයෙන් ගවයින්, මී හරකුන්, එළුවන්, කුකුළන් සහ ඌරන් ඇතිකිරීම අයත් වේ. රට තුළ ලියාපදිංචි සත්ව ගොවිපළ 600,000ක් පමණ ඇත. තවද කිරි ගොවීන් 250,000ක් ඇතුළුව ආසන්න වශයෙන් පවුල් ඒකක 600,000ක් සෘජුවම මෙම අංශයේ නියැලී සිටිති.රට තුළ ලියාපදිංචි පශු ගොවිපලවලින් 80%කට වඩා වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක වන්නේ අකර්මණ්‍ය ශ්‍රමිකයන් යොදවා ඌන උපයෝගීතා හෝ ආන්තික ඉඩම්වලය.

කිරි පරිභෝජනය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පදනම් කර ගත් මාර්ගෝපදේශයන්ට අනුව වැඩිහිටියෙකුගේ දෛනික පෝෂණ අවශ්‍යතාවය සපුරාලීම සඳහා කිරි/ කිරි නිෂ්පාදන මිලි ලීටර් 150 ක් පරිභෝජනය කළ යුතුය. කෙසේවෙතත් දේශීය නිෂ්පාදන මට්ටමට අනුව , අවශ්‍යතාවයෙන් 50 %ක් පමණක් දේශීයව සපුරනු ලැබේ. ඉතිරිය ආනයනික පිටිකිරි සහ කිරි නිෂ්පාදන මගින් සැපයෙන අතර ඒ සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 50 ක් පමණ වැය වේ.

කුකුල් කර්මාන්තය සම්පූර්ණයෙන්ම මෙහෙයවනු ලබන්නේ පෞද්ගලික අංශය විසිනි. රාජ්‍ය මැදිහත්වීම කුකුළු සෞඛ්‍ය කළමණාකරනය , පර්යේෂණ සහ කුකුළු නිෂ්පාදනවල තත්ත්ව සහතිකය යන ක්ෂේත්‍රවලට පමණක් සීමා වේ. ගෘහස්ථ පරිභෝජන අවශ්‍යතා සපුරාලීමට මෙම අංශයට හැකියාව ඇත. දැනට රට තුළ බිත්තර සඳහා ගොවිපළ 20,896 ක්, මස් සඳහා කුකුළු ගොවිපළ 10,490 ක් සහ ගෙවතු කුකුළු ගොවිපළ 222,943 ක් ලියා පදිංචි වී ඇත.

පශු සම්පත් අංශයේ රාජ්‍ය ප්‍රතිපත්තිය වන්නේ ස්වභාවික පරිසර පද්ධතිවල තිරසාර බව සහතික කරමින්, ගෘහස්ථ ජීවනෝපාය වැඩිදියුණුකිරීම හා අපනයන සඳහා සත්ත්ව නිෂ්පාදන යොමුකිරීම සඳහා මැදිහත්වීම තුළින් සත්ත්ව නිෂ්පාදන දේශීය ආර්ථිකය සඳහා ඵලදායී ලෙස දායක කර ගැනීමයි. ඒ අනුව සත්ත්ව අභිජනනය, සත්ත්ව සෞඛ්‍ය කළමණාකරණය සහ සත්ත්ව නිෂ්පාදන අංශය සංවර්ධනය සහ තත්ත්ව නියාමනය සඳහා රජය සෘජුව මැදිහත් වේ.

නිම කරන ලද කාර්යයන්:

- ව්‍යාපෘති යෝජනා 12 ක් ඇගයීම් සිදු කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.
- පශු සම්පත් අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 01 ක් සඳහා අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

**ඉඩම් හා වාරිමාර්ග අංශය**

**වාරිමාර්ග**

රටේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම, නව ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීම සහ පවතින ජල සම්පත වැඩි දියුණු කිරීමත් සමඟ සුදුසු, සාධාරණ ජලය බෙදා හැරීම සහතික කිරීම සඳහා වාරිමාර්ග අංශය අත්‍යවශ්‍ය වේ. ඒ අතරම නව ව්‍යාපෘති රැසක් කෘෂිකාර්මික හා වෙනත් ජල අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීම සඳහා ආරම්භ කර ඇති අතර ඒ යටතේ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය, ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය, දේශගුණික බලපෑම අවම කිරීමේ බහු අදියර වැඩසටහන යන ව්‍යාපෘති ප්‍රධාන වේ. කෙසේ වෙතත්, රටේ පවතින වත්මන් මූල්‍ය තත්ත්වයත් සමඟ, මෙම වැඩසටහන්

ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය අවශ්‍ය විකල්ප සමඟ නැවත නිරීක්ෂණය කර ඇත. කෙසේ වෙතත්, ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා එහි සෘජු දායකත්වය හේතුවෙන් එල්ලංගා සංවර්ධනය හරහා ජල සම්පත් සංවර්ධනය ප්‍රමුඛ මැදිහත්වීමක් ලෙස හඳුනාගෙන ඇත. තවද, ජලය අපතේ යෑම වැළැක්වීම සඳහා ජල ප්‍රවාහන පද්ධති වැඩිදියුණු කිරීම හෝ අවශ්‍ය පුනරුත්ථාපන කටයුතු සිදු කෙරේ.

**ඉඩම් සම්පත**

ප්‍රයෝජනයට නොගත් සහ ඌන උපයෝගිතා ඉඩම් ඵලදායී භාවිතය සඳහා ගෙන ඒම ආර්ථිකය නංවාලීමේ මූලික අවශ්‍යතාවක් ලෙස පිළිගැනේ. ඉඩම් සම්පතේ ඵලදායිතාව ඉහළ නැංවීම, තරඟකාරීත්වය සහ ආදායම වැඩි කිරීම සඳහා තීරණාත්මක සාධකයකි. එබැවින් හොඳම විකල්පය සඳහා ඉඩම් භාවිතා කිරීම ආර්ථිකය නංවාලීම සඳහා උපකාරී වේ. ඉඩම් බැංකුවේ ප්‍රවේශය ප්‍රධාන වශයෙන් ඉලක්ක කර ඇත්තේ ආර්ථිකයේ ආයෝජන සහ වර්ධනය ඉහළ නැංවීම සඳහා ය. මෙම සංකල්පය ප්‍රධාන නියෝජිතායතනය ලෙස අමාත්‍යාංශය විසින් භාර ගනු ලබන අතර අදාළ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහාය ද ලැබේ. මීට අමතරව, “බිම්සවිය” වැඩසටහන පසුගිය වසර කිහිපය පුරා ක්‍රියාත්මක කර ඇති අතර ප්‍රධාන වශයෙන් ඉඩම් පරිහරණය සහ සංවර්ධනය වැඩිදියුණු කිරීමේ අදහසින් වඩාත් ශක්තිමත් සහ නිරවුල් ඉඩම් අයිතිය ලබා දීම සඳහා මෙන්ම ඉඩම් හිමිකම හෝ සීමා මායිම් හේතුවෙන් ඇති වන අනවශ්‍ය ආරවුල් මඟහරවා ගැනීම අරමුණු කර ගෙන ඇත. අවශ්‍ය පරිපාලන හා නීතිමය සංශෝධන සහිතව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සුදුසු පරිදි වේගවත් කර ඇත.

**විශේෂ කාර්යයන්**

- ඉඩම් හා වාරිමාර්ග අංශ වලට අදාලව ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජන 48 ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය සහ වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ 08 ක් ඉදිරිපත් කරන ලදි.
- ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය, ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික විපර්යාසවලට කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සහභාගී වීම.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම්වලට සහභාගී වීම.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව සහය සටහන (Aide Memoire) සඳහා නිරීක්ෂණ ලබා දීම.
- ජාතික අයවැය දෙපාර්තෙමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තෙමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

**වැවිලි**

වැවිලි අංශය රටෙහි ආර්ථිකයේ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි. තේ, රබර් සහ පොල් ප්‍රධාන වැවිලි බෝගයන් වන අතර, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත්, උක්, බඩ ඉරිඟු සහ කහ මෙම අංශයට අයත් අනෙකුත් සුළු අපනයන බෝගයන් වේ. වර්තමානයේදී, දළ දේශීය නිෂ්පාදිතයට මෙම අංශයේ දායකත්වය 2% ක් පමණ වන අතර, රටෙහි සමස්ත අපනයන අදායමට දක්වන දායකත්වය 24% ක් පමණ වේ. වැවිලි අංශය ආශ්‍රිතව මිලියන 1.5 ක පමණ පිරිසකට ජීවනෝපාය අවස්ථා නිර්මාණය වී ඇත. නිෂ්පාදනය වැඩි කිරීම හා, අපනයන විවිධාංගීකරණය තුළින් අපනයන ඉහළ නැංවීම හරහා වැවිලි ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට 2024 වර්ෂයේ කටයුතු කරන ලදී.

**නිම කරන ලද කාර්යයන්**

- අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 23 ක් ඇගයීමට ලක් කර යෝජනා 07ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 05 ක් සඳහා නිරීක්ෂණ/අදහස් ඉදිරිපත් කරන ලදී.

**විශේෂ කාර්යයන්**

- ශ්‍රී ලංකාවේ වැවිලි අංශය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත සමාලෝචනය කිරීම.
- 2025 වර්ෂය සඳහා තේ, පොල්, රබර් සහ අපනයන කෘෂිකාර්මික බෝග පිළිබඳ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් රැස්වීමක් සංවිධානය කර සංශෝධන සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීම.
- කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනයේ (KOICA) 2026 වර්ෂයේ අරමුදල් සපයන වැඩසටහන සඳහා නව ව්‍යාපෘති සංකල්ප පත්‍රිකා දෙකක් ඉදිරිපත් කිරීම.
- රටෙහි අපනයන ආදායම වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකා කුරුඳු කර්මාන්තයේ උපරිම විභවය හඳුනාගැනීමට අදාළ ආයතන සමග සාකච්ඡා 02 ක් පැවැත්වීම.
- ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය සඳහා උපායමාර්ගික සැලැස්මක් සහ මාර්ග සිතියමක් සකස් කිරීම සම්බන්ධයෙන් වන මෙහෙයුම් කමිටුවට සහභාගී වීම.

**ධීවර**

ශ්‍රී ලංකාවේ තිරසර ආර්ථික සංවර්ධනයට උපයෝගී කර ගත හැකි අති විශාල ධීවර හා ජලජ සම්පත් හා ඒ ආශ්‍රිත අවස්ථාවන් ශ්‍රී ලංකාව සතුව පවතී. ධීවර අංශය රටෙහි දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය 1% ක් පමණ වන අතර, වර්තමානයේදී වාර්ෂික මත්ස්‍ය හා ධීවර නිෂ්පාදන අපනයන ආදායම ඇ. ඩො. මිලියන 300 ක් පමණ වේ. දැනට ධීවර පවුල් මිලියනයකට වඩා සිටින අතර, මෙම අංශය පුද්ගලයින් 586,000 කට පමණ සෘජු හා වක්‍ර රැකියා සපයනු ලබයි. මධ්‍ය කාලීන අයවැය රාමුව තුළ, ධීවර නිෂ්පාදනවල ස්වයංපෝෂිතභාවය අත්කර ගැනීම හරහා ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සහ අපනයන ආදායම වැඩිකර ගැනීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, ධීවර වරායන් සහ නැංගුරම්පොළවල් සංවර්ධනය කිරීම, මිරිදිය මත්ස්‍ය කර්මාන්තය වැඩිදියුණු කිරීම, ජලජීවී වගා නිෂ්පාදනය වැඩි කිරීම, පර්යේෂණ හා සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ ධීවර ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා රාජ්‍ය ආයෝජන සිදු කර ඇත.

**නිම කරන ලද කාර්යයන්**

- අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 10 ක් ඇගයීමට ලක් කර ව්‍යාපෘති යෝජනා 05ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 05 ක් සඳහා නිරීක්ෂණ/අදහස් ඉදිරිපත් කරන ලදී.

**විශේෂ කාර්යයන්**

- ධීවර හා ජලජීවී වගාව පිළිබඳ ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත සමාලෝචනය කිරීම.
- කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනයේ (KOICA) 2026 වර්ෂයේ අරමුදල් සපයන වැඩසටහන සඳහා නව ව්‍යාපෘති සංකල්ප පත්‍රිකා දෙකක් ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ආර්ථික පරිවර්තනයට සහාය වීම සඳහා තිරසර අපනයන නැඹුරු වාණිජ ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ උපායමාර්ගයට අදාළ පුද්ගලික ආයෝජන ප්‍රවර්ධන උප විශේෂඥ කමිටුවට සහභාගී වීම.

- ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ආර්ථික පරිවර්තනයට සහය වීම සඳහා තිරසර අපනයන නැඹුරු වාණිජ ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ උපායමාර්ග යටතේ 2025 දී සම්පූර්ණ කළ යුතු කඩිනම් පූර්ව අවශ්‍යතා හඳුනාගැනීම සඳහා රැස්වීමක් සංවිධානය කිරීම.

## 2.3 කර්මාන්ත, වෙළෙඳ, ආයෝජන සහ සංචාරක

### කර්මාන්ත අංශය

කාර්මීකරණයෙන් ඔබ්බට අපේක්ෂා කරන, නවෝත්පාදනයන් පෝෂණය කිරීම, අපනයන දිරිමත් කිරීම, රැකියා අවස්ථා ලබා දීම සහ ආදායම් වැඩි කිරීම හරහා රටේ ආර්ථිකය ඉහළ මට්ටමක ස්ථානගත කිරීමේ විශාල වගකීමක් කර්මාන්ත අංශයට පැවරේ. ඊට අමතරව, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාවය සහ කලාපීය අසමානතාවය අන් සියල්ලටම වඩා කාර්මිකකරණ ක්‍රියාවලියේ වෙනස්කම් මගින් හොඳින් පැහැදිලි වේ. 2023 වසරේ සංඛ්‍යාලේඛනවලට අනුව, කර්මාන්ත අංශය දළ දේශීය නිෂ්පාදිතය (GDP) සඳහා දළ වශයෙන් සියයට 25.3 ක් සහ මුළු සේවා නියුක්තියෙන් සියයට 25.5 ක් වන අතර රටේ සමස්ත අපනයන සඳහා දළ වශයෙන් සියයට 78 ක් දායක විය. ව්‍යාපාර සහ ව්‍යවසායකත්ව සංවර්ධනය, ඇඟලුම් කර්මාන්තය, මෝටර් රථ සංරචක කර්මාන්තය, පතල් කැණීම් සහ රසායනික කර්මාන්තය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් කර්මාන්ත අංශයේ ප්‍රධාන ක්ෂේත්‍ර ලෙස හඳුනාගෙන ඇත. මෙවන් පසුබිමක, එකී විභව කාර්මික ක්ෂේත්‍ර ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය යෙදවුම් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබයි. තවද, කර්මාන්ත අංශයට අදාළ ව්‍යාපෘති යෝජනා සඳහා පූර්ව ඇගයීම් ක්‍රියාවලියට සම්බන්ධ වන අතරම, ආංශික මූල්‍යකරණයටද මෙම දෙපාර්තමේන්තුව මැදිහත් වේ.

රටේ කර්මාන්ත අංශය නඟා සිටුවීමේ අරමුණට සමගාමීව 2024 වර්ෂය තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 56 ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අදාළ රේඛීය ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 02ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති පිළිබඳ දත්ත සහ තොරතුරු රැස් කිරීම සහ යාවත්කාලීන දත්ත ගබඩාවක් (Data Repository) පවත්වාගෙන යාම.
- කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත (නව) සහ දැනට ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් දත්ත රැස් කිරීම සහ ඒ අනුව මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම.
- මෙහෙයුම් කමිටු, ප්‍රගති සමාලෝචනය සහ විදේශ දූත මණ්ඩල ඇතුළු රැස්වීම්වලට සක්‍රීයව සහභාගී වීම.
- රටේ සංවර්ධන රාමුවට අනුකූලව සුදුසු ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත අවශ්‍ය උපදේශන සහාය ලබා දීම.
- ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය වන සඳහා ජාතික ප්‍රතිපත්තිය සැකසීම සම්බන්ධ රැස්වීම්වලට සහභාගී වී අවශ්‍ය උපදේශන සහය ලබා දීම.

## වෙළඳ අංශය

වෙළඳ අංශය මගින් වෙළෙන්දන්, සේවා සපයන්නන් සහ පාරිභෝගිකයන්ගේ වෙළඳ අයිතිය තහවුරු කරමින් දේශීය හා විදේශීය වෙළඳාම සඳහා පහසුකම් සලසනු ලබයි. ඩිජිටල්කරණය සහ විද්‍යුත් වාණිජකරණය මූලික කරගත් තාක්ෂණික නිපැයුම් මත පදනම් වූ අපනයන විවිධාංගීකරණය හා සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය වෙත මූලික අවධානය යොමු කරමින්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂය තුළ නිම කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 02 ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අදාළ රේඛීය ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 02ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති පිළිබඳ දත්ත සහ තොරතුරු රැස් කිරීම සහ යාවත්කාලීන දත්ත ගබඩාවක් (Data Repository) පවත්වාගෙන යාම.
- ප්‍රධාන සංවර්ධන ක්ෂේත්‍ර හඳුනාගෙන ගැටළු සහ අභියෝග, අංශයේ ප්‍රතිපත්ති දිශානතිය, ප්‍රධාන උපාය මාර්ග සහ වෙළඳ අංශය සඳහා සකසා ඇති උපාය මාර්ග හරහා සාක්ෂාත් කරගත යුතු අනාගත ඉලක්ක අනුව වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතාව සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය සහ අදාළ රේඛීය ආයතන විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත (නව) සහ දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් දත්ත රැස් කර, මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා යාවත්කාලීන කිරීම.

## ආයෝජන ප්‍රවර්ධනය

පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයේ අහිතකර බලපෑම මධ්‍යයේ, ශ්‍රී ලංකාව සැලකිය යුතු ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා අභියෝගාත්මක මාවතක ගමන් කරයි. රජයේ ප්‍රමුඛතාවය වන්නේ තිරසාර දේශීය හා විදේශීය ආයෝජන හරහා නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීම සහ අපනයන ප්‍රවර්ධනය කිරීමයි. ඒ අනුව, විදේශ ආයෝජන ආකර්ෂණය කර ගනිමින් ජාතික සංවර්ධන ඉලක්කවලට අනුකූලව සමාජීය හා කාර්මික අංශවල පරිවර්තනයක් තුළින් ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධනය ඉතා වැදගත් වේ. ඉහත ප්‍රතිඵල ඉලක්ක කොට ගෙන ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව පහත සඳහන් කාර්යයන් සම්පූර්ණ කර ඇත.

- ව්‍යාපෘති යෝජනා 10ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට සහ අදාළ රේඛීය ආයතනවලට නිර්දේශ ඉදිරිපත් කිරීම
- ආයෝජන ප්‍රවර්ධනයට අදාළ කැබිනට් සංදේශ 02ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම
- රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති පිළිබඳ දත්ත සහ තොරතුරු රැස් කර යාවත්කාලීන දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.
- ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද නව සහ ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් දත්ත රැස් කර, ඒ අනුව රට සඳහා මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා යාවත්කාලීන කිරීම.
- මෙහෙයුම් කමිටු, ප්‍රගති සමාලෝචන සහ විදේශ දූත මණ්ඩල රැස්වීම් සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම
- රටේ සංවර්ධන රාමුවට අනුකූලවන පරිදි ව්‍යාපෘති ගොඩනැගීම සඳහා රේඛීය අමාත්‍යාංශ ඇතුළු අදාළ පාර්ශ්වකරුවන්ට අවශ්‍ය උපදේශන සහාය ලබා දීම.

**සංචාරක අංශය**

සත්කාරක රටවලට ආර්ථික, සමාජ-සංස්කෘතික සහ පාරිසරික ප්‍රතිලාභ ගෙන එන සංචාරක කර්මාන්තය ගෝලීය වශයෙන් ප්‍රමුඛ පෙළේ කර්මාන්තවලින් එකකි. සංචාරක කර්මාන්තයේ ප්‍රධාන සම්පත් ස්වභාවික, සංස්කෘතික, මානව සහ ප්‍රාග්ධනය යන ප්‍රධාන ක්ෂේත්‍ර හතරකින් හඳුනාගත හැකිය. මෙම සම්පත් ඵලදායි ලෙස ඒකාබද්ධ කිරීමෙන් මනාව සැලසුම් කළ සංචාරක කර්මාන්තයක් දියුණු කළ හැකිය. "පොහොසත් රටක් ලස්සන ජීවිතයක් "යන දැක්ම සහිත ශ්‍රී ලංකාවේ සංවර්ධන න්‍යාය පත්‍රය තුළ සංචාරක ව්‍යාපාරය එහි ආර්ථිකයේ විදේශ විනිමය උපයන නවීකරණය කරන ලද සංචාරක කර්මාන්තයක් - ආකර්ශනීය අවසාන ගමනාන්තයක් ලෙස දියුණු කළ හැකි වැදගත් අංශයක් ලෙස හඳුනාගෙන ඇත. සංචාරක ව්‍යාපාරය ස්වභාවික පරිසරය හා සොබා සෞන්දර්ය මත පදනම් වූ සහ දේශීය සංස්කෘතියට හිතකර කර්මාන්තයක් ලෙස පුළුල් ජනතා සහභාගීත්වයෙන් සංවර්ධනය කිරීම රජයේ ප්‍රතිපත්තිය වේ. ඒ අනුව, 2024 වසරේ විදේශ සංචාරකයින්ගේ පැමිණීමේ පැහැදිලි වර්ධනයක් ඇති කරමින් විදේශ සංචාරකයින් අතර ශ්‍රී ලංකාව දකුණු අසියානු කලාපය තුළ ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට සංචාරක අංශය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතන විසින් අවශ්‍ය පියවර ගනිමින් සිටි.

සංචාරක අංශය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ප්‍රතිපත්ති සම්පාදනයට සහායවීම, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබාදීම හා ජාතික/ආංශික සංවර්ධන සැලසුම් ඇගයීම සඳහා දායකත්වය ලබා දේ. ඒ අනුව සංචාරක අංශය 2024 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු අවසන් කරන ලදි.

- සංචාරක අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 02ක් සඳහා නිරීක්ෂණ සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යවරයා වෙනුවෙන් නිරීක්ෂණ ලබාදෙන ලදි.
- ව්‍යාපෘති යෝජනා 13ක් ඇගයීමට කර නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- "පින්නවල - කිතුල්ගල සංචාරක කොරිඩෝව සංවර්ධනය" සහ "පළාත් පාලන ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය" යන 2024 අයවැය යොජනා වැඩ සටහන් සම්බන්ධයෙන් සැලකිය යුතු වැඩ ප්‍රමාණයක් සිදු කිරීම.

## 2.4 වානිජ යටිතල පහසුකම්

### ප්‍රවාහන, මාර්ග, වරාය හා ගුවන් සේවා

ප්‍රවාහන අංශය රටක සංවර්ධනයේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එය ජනතාව, සම්පත් හා වෙළඳපොළවල් සම්බන්ධ කරමින් අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා හා රැකියා සඳහා ප්‍රවේශය පහසු කරයි. කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් වෙළඳ තරගකාරීත්වය වැඩි දියුණු කරන අතර, පිරිවැය හා ගමන් කාලය අඩු කර ආර්ථික වර්ධනය ඇති කරයි. මෙම අංශයේ වැඩිදියුණු කිරීම් කාර්මික ව්‍යාප්තියට, වෙළඳාම් වර්ධනයට සහ සංචාරක සංවර්ධනයට සෘජුවම දායක වේ.

ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගත් විට, ප්‍රවාහන යටිතල පහසුකම් සඳහා කරන ආයෝජන සැලකිය යුතු මට්ටමක පවතින අතර, බොහෝවිට එම ව්‍යාපෘති මහා පරිමාණ ව්‍යාපෘති බැවින්, සම්පත් වගකීමෙන් වෙන් කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, පොදු ප්‍රවාහනය නවීකරණය කිරීම, මාර්ග තදබදය සහ අනතුරු අඩු කිරීම, පරිසර හිතකාමී විදුලි ප්‍රවාහනය ජනප්‍රිය කිරීම සහ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධනයට දායක වීම යන අරමුණු සඳහා ව්‍යාපෘති සාර්ථකව තෝරාගෙන ඇගයුම් කරන ලදී.

### නිම කරන ලද කාර්යයන්

- අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති හා වැඩසටහන් (17) ඇගයීම.
- ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය හෝ මෙම අංශවලට අදාළව ඕනෑම අමාත්‍යාංශයක් විසින් ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල සංදේශ හා ප්‍රතිපත්ති පත්‍රිකා පිළිබඳ නිරීක්ෂණ (38) සකස් කිරීම.
- ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීමේදී අදාළ රේඛීය අමාත්‍යාංශවලට තාක්ෂණික යෙදවුම් ලබා දීම.
- ශ්‍රී ලංකා ජාතික නාවික ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාවේ ජාතික ගොඩබිම් ප්‍රවාහන ප්‍රතිපත්තිය හා ශ්‍රී ලංකා තිරසාර ගුවන් සේවා පාරිසරික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
- පහත සඳහන් කමිටුවල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
  - ශ්‍රී ලංකාවේ ජාතික ගොඩබිම් ප්‍රවාහන ප්‍රතිපත්තිය සකස් කිරීම.
  - ව්‍යාපෘති මෙහෙයුම් කමිටු.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන සහ දෙපාර්තමේන්තුව විසින් වරින් වර සකස් කරනු ලබන අනෙකුත් වාර්තා සඳහා අවශ්‍ය දත්ත හා තාක්ෂණික තොරතුරු ලබා දීම.
- විදේශ ආධාර සඳහා වන දූත මණ්ඩල සටහන් සඳහා නිරීක්ෂණ ලබා දීම.

### බලශක්තිය

බලශක්ති අංශය නවීන කාර්මික ආර්ථිකයන් සඳහා වැදගත් වන අතර, ආර්ථික හා සමාජීය සංවර්ධනයට ද හේතු වේ. ගෝලීය වශයෙන්, පුනර්ජනනීය බලශක්තිය, විද්‍යුත් වාහන භාවිතය සහ කාබන් විමෝචනය අඩු කිරීමේ ප්‍රතිපත්ති වෙත මාරුවීමක් සිදුවී ඇති අතර, ශ්‍රී ලංකාව සිය බලශක්ති ප්‍රභවයන් විවිධාංගීකරණය කරමින් මෙම ප්‍රවණතා පිළිබිඹු කරයි. ශ්‍රී ලංකාව පෙට්‍රෝලියම් (38%), ජෛව ස්කන්ධ (32%), ගල් අඟුරු (13%), ජල (11%) සහ නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් (6%) මත රඳා පවතින අතර, ජෛව ස්කන්ධ ප්‍රධාන වශයෙන් ගෘහස්ථ ආහාර පිසීම සඳහා භාවිතා කරයි. විදුලි ජනනය ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර 2025 සිට 2035 දක්වා 6.25% ක වාර්ෂික ඉල්ලුම වැඩිවීමක් ද පෙන්නුම් කරයි. වසර 2038-2042 වන විට න්‍යෂ්ටික බලය විදුලි ජනනය සඳහා යොදා ගැනීමටද සලකා බලමින් පවතී.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය ආනයනික ෆොසිල ඉන්ධන මත යැපීම ඇතුළුව සැලකිය යුතු අභියෝගවලට මුහුණ දෙන අතර, එය මිල අස්ථාවරත්වයට සහ සැපයුම් අඩාල කිරීම්වලට හේතු වේ. මෙම අංශය අධික පිරිවැය, නියාමන අභියෝග සහ ග්‍රාමීය ප්‍රදේශවල අවම බලශක්ති ප්‍රවේශය, තාක්‍ෂණය අනුගත වීම අවම වීම සහ ආන්තික කාලගුණයට ගොදුරු වීමේ අවදානම යන අභියෝගවලට මුහුණ දෙනු ලබයි. යල් පැන ගිය යටිතල පහසුකම් සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ඒකාබද්ධ කිරීමේ දුෂ්කරතා මෙම තත්ත්වය තවදුරටත් සංකීර්ණ කරයි. මෙම ගැටළු මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකාවට සූර්ය, සුළං සහ ජෛව ස්කන්ධ බලශක්ති විභවයන් මෙන්ම ජාල සේවා වැඩිදියුණු කිරීම, බලශක්ති ගබඩා විකල්පයන් ගවේෂණය කිරීම සහ පුනර්ජනනීය බලශක්ති සහ ස්වාභාවික වායු යටිතල පහසුකම් සඳහා පුද්ගලික හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම ඇතුළුව වර්ධනය සඳහා අවස්ථා ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රතිපත්තිවල අරමුණ වන්නේ පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, බලශක්ති වෙළඳපොලේ තරඟකාරිත්වය වර්ධනය කිරීම, දේශීය නිෂ්පාදනය හරහා බලශක්ති සුරක්ෂිතභාවය ඉහළ නැංවීම සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් දිරිමත් කිරීම මගින් නියාමන ප්‍රතිසංස්කරණ සහ නව්‍ය පිරිසිදු බලශක්ති විසඳුම් ආමන්ත්‍රණය කිරීම තුළින් සියලු පුරවැසියන් සඳහා දැරිය හැකි, තිරසාර සහ සුරක්ෂිත බලශක්තිය සහතික කිරීමයි.

ඒ අනුව 2024 වර්ෂය ඇතුලත ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ දායකත්වය පහත පරිදි වේ.

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ව්‍යාපෘති යෝජනා 13 ක් ඇඟයීමට ලක් කර නිරීක්ෂණ ලබා දී ඇත.
- "රටේ ස්වභාවික වායු යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය නැවත සලකා බැලීම" සහ "සංවර්ධනය සඳහා හරිත හයිඩ්‍රජන් තාක්‍ෂණය ක්‍රියාත්මක කිරීම" පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශ ඇතුළුව අමාත්‍ය මණ්ඩල සංදේශ 11ක් සඳහා නිරීක්ෂණ ලබා දී ඇත.
- පුනර්ජනනීය විදුලි බල හා බලශක්ති යෝජනා ආදී ආයෝජන යෝජනා වලට නිරීක්ෂණ හා අදහස් ලබාදී ඇත.
- විදේශ දූත මණ්ඩලවලට අදාළ කරුණු පිළිබඳව නිරීක්ෂණ ලබා දීම.
- අදාල ආයතන සම්බන්ධ කර ගනිමින්, වහල මත සූර්ය පැනල ආශ්‍රිතව පවතින අභියෝග විශ්ලේෂණය කිරීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූලිකත්‍වයෙන් ශ්‍රී ලංකා බැටරි බලශක්ති සංචිත පද්ධති ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්ව විද්‍යාල, රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශයන්හි ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් ස්ථාපිත කරන ලදී. ඒ අනුව තාක්ෂණික උපකමිටු 3 ක් ස්ථාපනය කල අතර පසුගිය වසරේ රැස්වීම් වාර 3 ක් පවත්වන ලදී.
- ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව (NDPF) 2025-2050 සකස් කිරීමට දායකත්වය සපයන ලදී.

**පානීය ජලය සහ සනීපාරක්ෂක**

පානීය ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශය, ජාතික ප්‍රතිපත්තීන් හා අනුගත වෙමින් සමස්ත ප්‍රජාව වෙත සුරක්ෂිත පානීය ජලය සහ ගුණාත්මක සනීපාරක්ෂක පහසුකම් ලබාදීම වෙත අවධානය යොමු කරන ලදී. මෙහිදී පවත්නා ජල සම්පාදන පද්ධතීන් හි ධාරිතාව එහි උපරිම ධාරිතාවය දක්වා වැඩි කිරීම, ආදායම් උත්පාදනය නොකරන ජලය ප්‍රතිශතය අඩු කිරීම, ප්‍රමුඛතාවයන් සහිතව නව පානීය නල ජල සම්බන්ධතා ලබාදීම, 2% ක පමණ අවම මට්ටමේ පවතින නල අපවහන පද්ධතිය තවදුරටත් ව්‍යාප්ත කිරීම මෙන්ම, නල ජලය හෝ නල අපවහන පහසුකම් ලබාදිය නොහැකි ප්‍රදේශ සඳහා විකල්ප විසඳුම් වෙත අවධානය යොමු කිරීම වැනි අංශයන් පිළිබඳව විශේෂයෙන්ම සලකා බලන ලදී.

2024 වර්ෂයේදී, මෙම අංශයට අදාලව රේඛීය අමාත්‍යාංශ විසින් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති 15ක් ඇගයීමට ලක් කිරීමෙන් පසුව ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදෙන ලදී. එසේම, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 16 ක් සඳහා නිරීක්ෂණ, අදහස් සහ සටහන් ලෙස අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කොට ඇත. තවද, 2024 වර්ෂය තුලදී ජාතික පානීය ජලය පිලිබඳ ප්‍රතිපත්තිය සහ ජාතික ජල සුරක්ෂිතතාවය පිළිබඳ ප්‍රතිපත්තිය සමාලෝචනය කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. එමෙන්ම, ශ්‍රී ලංකාවේ පානීය ජල ක්ෂේත්‍රයේ ආයෝජන සඳහා ව්‍යාපෘති තෝරා ගැනීමේ ප්‍රමුඛතා සහිත නිර්ණායක රාමුව සකස් කිරීම අවසන් කිරීම සඳහා අවශ්‍ය පූර්ණ සහාය ලබාදෙන ලදී. එමෙන්ම, පවත්නා සීමිත අයවැය හමුවේ 2024 වසර තුල ක්‍රියාත්මක වෙමින් තිබූ ජල සම්පාදන සහ සනීපාරක්ෂාව සඳහා වූ ව්‍යාපෘතීන් එම වසර සඳහා වූ මූල්‍ය රාමුව තුල ප්‍රශස්ත මට්ටමින් කළමනාකරණය කරගැනීම සඳහා අවශ්‍ය මගපෙන්වීම සියලුම පාර්ශවකරුවන් වෙත ලබාදෙන ලදී.

**නාගරික සහ නිවාස සංවර්ධනය**

නාගරික සංවර්ධනය රටක සමස්ත සංවර්ධනයේ සහ සමෘද්ධියේ මට්ටම නිරූපනය කරයි. නාගරික සංවර්ධනයට සහය වීම සඳහා රජය වැසි ජල පාලනය, ජලාපවහන වැඩිදියුණු කිරීම්, නාගරික පාරිසරික වැඩිදියුණු කිරීම්, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය, සනීපාරක්ෂක සහ වාහන නැවැත්වීමේ පහසුකම්, නාගරික උද්‍යාන, සංචලනය, සම්බන්ධතාව සහ පොදු පහසුකම් සංවර්ධනය ඇතුළු විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි. මෙම මූල පිරීම් නගර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන අතර සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනයට ද සහාය වේ.

ප්‍රමාණවත් නිවාස සඳහා පහසුකම් සැලසීම තිරසර සංවර්ධන අරමුණු ලඟා කරගැනීම සඳහා ඉතා වැදගත් වේ. එබැවින්, රට තුල විවිධ කණ්ඩායම්වල නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා රජය විවිධ නිවාස ව්‍යාපෘති ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘති මූලික වශයෙන් ඉලක්ක කරන්නේ අඩු ආදායම්ලාභී කණ්ඩායම්, වතු ප්‍රජාව, නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසවල පදිංචිකරුවන් සහ උතුරු නැගෙනහිර අර්බුධය හේතුවෙන් අවතැන් වූ පවුල් වේ. මීට අමතරව, රජය විසින් මධ්‍යම ආදායම්ලාභී පවුල් ඉලක්ක කරගත් නිවාස වැඩසටහන් නාගරික ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

ඉන්දීය රජය සහ මහජන චීන සමූහාණ්ඩුව ශ්‍රී ලංකාවේ නිවාස ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම සඳහා සෘජු ප්‍රදාන ආධාර සපයයි. රජයේ අරමුදල්වලින් ඔබ්බට, රටේ නාගරික නිවාස වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන හවුල්කරුවන්ගේ සහාය ද යොදා ගැනේ.

**නිම කරන ලද කාර්යයන්**

- අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් 15 සඳහා නිරීක්ෂණ ලබා දීම
- සංවර්ධන ව්‍යාපෘති යෝජනා 31 ක් තක්සේරු කිරීම සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට අදාළ ගැටළු සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ දැන්වීම
- ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘතිවල විෂය පථය, පිරිවැය සංශෝධනය සහ කාලය දීර්ඝ කිරීම වැනි වෙනස්කම් පිළිබඳ නිර්දේශ ලබා දීම
- 2025-2027 රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම
- ව්‍යාපෘති මෙහෙයුම් කමිටු / ප්‍රගති සමාලෝචන රැස්වීම්/ ව්‍යාපෘති සහ වැඩසටහන් පිළිබඳ විශේෂිත රැස්වීම් සඳහා සහභාගී වීම
- මෙම අංශයට විශේෂිත ජාතික සහ ආංශික ප්‍රතිපත්ති ලේඛන සකස් කිරීම
- නාගරික සංවර්ධන හා නිවාස ව්‍යාපෘතිවලට අදාළ වාර්තා සකස් කිරීම
- නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ සහ එහි සංවර්ධන ව්‍යාපෘතිවල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කිරීම
- ආංශික සැලසුම් සකස් කිරීම සහ සංවර්ධනය සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම

## 2.5 පාලනය

2024 වර්ෂයේ දී පාලන අංශය විසින් මෙරට කාර්යක්ෂම රාජ්‍ය සේවයක් හා නීතිය ක්‍රියාත්මක වන සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම පිණිස රජයේ ජාතික ආර්ථික ප්‍රතිපත්තිය මඟින් ප්‍රකාශිත අරමුණු හා ක්‍රමෝපායන් හා පදනම්ව වැදගත් කාර්යභාරයක් ඉටු කොට ඇත.

තවද, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමේ දී මෙන්ම මධ්‍යකාලීන අයවැය රාමුව සකස් කිරීමේ දී තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම අරමුණු කොට ක්‍රියාත්මක වී ඇත. එසේම නව තාක්ෂණය සබැඳි මහජන මිත්‍රශීලී රාජ්‍ය සේවයක් ගොඩනැගීම, ප්‍රජාතන්ත්‍රවාදී නිදහස සුරැකීම, මිත්‍රශීලි නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, වංචාවෙන් හා දූෂණයෙන් තොර රටක් බිහි කිරීම, හා රාජ්‍ය සේවය තුළ වගවීම තහවුරු කිරීම අරමුණු කොට පහත සඳහන් රාජ්‍ය අමාත්‍යාංශ හා අනෙකුත් ව්‍යුහයන්ට අදාල ක්ෂේත්‍රයන් හි ක්‍රමසම්පාදන ක්‍රියාවලියට දායකවී ඇත.

- රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන
- මහජන ආරක්ෂාව
- ජාතික ආරක්ෂාව
- ජනමාධ්‍ය
- අධිකරණ
- විදේශ කටයුතු
- ආගමික, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන්
- රාජ්‍ය කළමනාකරණ
- ස්වාධීන කොමිෂන් සභා හා විශේෂ වියදම් ඒකක

ඒ අනුව, කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය කළමනාකරණයක් උදෙසා 2024 වර්ෂයේදී,

- රජයේ අරමුදල හෝ විදේශ අරමුදල මඟින් මූල්‍යයන කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා 73 ඇගයීමට ලක් කිරීම.
- විවිධ අමාත්‍යාංශ යටතේ ඉදිරිපත් වූ අමාත්‍ය මණ්ඩල සංදේශ 41 සඳහා නිරීක්ෂණ හා විචාර ලබා දීම.
- අංශයේ විෂය පථය යටතේ මෙහෙයුම් කමිටු ප්‍රගති සමාලෝචන රැස්වීම් හා ව්‍යාපෘති පිළිබඳ වැඩිදුර සාකච්ඡා කිරීම සහ සහභාගී වීම.
- ආර්ථික සංවර්ධනය සඳහා හිතෙෂී පරිසරයක් සකස්කිරිම හා කාර්යක්ෂම මහජන සේවයක් තහවුරු කිරීමට යහපාලන යටතේ වූ රාජ්‍ය ආයතන යොමුකිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කල කමිටුවක් ඇතුළුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු 04 ක් හා ප්‍රතිපත්ති සැකසීමේ හා සමාලෝචනය කිරීමේ කමිටු 03 ක් සඳහා දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය නියෝජනය කරමින් එම රැස්වීම් වලට සහභාගි වීම.

### සාර්ව ආර්ථික

මෙම දෙපාර්තමේන්තුවේ සාර්ව ආර්ථික අංශය යනු සියලුම සංවර්ධන අංශ සාර්ව ප්‍රතිපත්ති රාමුවකට ඒකාබද්ධ කරන අංශයයි. මෙම අංශය පොදු සංවර්ධන ඉලක්ක සකස් කිරීම සඳහා සංවර්ධනයේ අනෙකුත් අංශවලට ද මග පෙන්වයි. මෙම අංශය දේශීය හා විදේශීය ආර්ථිකයන් අධ්‍යයනය කරන අතර දේශීය ආර්ථිකයේ ඇති අවස්ථා සහ අභියෝග හඳුනාගෙන පවතින සීමිත සම්පත් වඩා ඵලදායී සංවර්ධන කටයුතු වෙත යොමු කරවීමට මග පෙන්වයි. මීට අමතරව, රාජ්‍ය ආයෝජන කළමනාකරණය කිරීමේ අරමුණින් දැනට පවතින මූල්‍ය සම්පත් ජාතික ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා වෙන් කිරීම සඳහා මෙම අංශය විසින් 2024 – 2026 රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) සකස් කරන ලදී. ඒ අනුව සාර්ව ආර්ථික අංශය මගින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

ආර්ථිකයේ ඇති අවස්ථා සහ අභියෝග හඳුනාගෙන පවතින සීමිත සම්පත් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ලෙස යොමු කිරීමට නිර්දේශ ලබා දේ.

රාජ්‍ය ආයෝජන සැලැස්මේ 2024-2026 හි අදාළ පරිච්ඡේදය සකස් කිරීම සඳහා ඒ ඒ අංශවලට මඟ පෙන්වීම.

- රාජ්‍ය ආයෝජන සැලැස්මේ 2024-2026 සම්පාදනය කර එය ජාතික විමර්ශන ලේඛනයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.
- සාර්ව ආර්ථික ප්‍රවණතා විශ්ලේෂණය කිරීම සහ ශ්‍රී ලංකා ආර්ථිකයේ ඇති අවස්ථා සහ අභියෝග හඳුනා ගැනීම.
- රාජ්‍ය මූල්‍ය කලමණාකරණය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය  සහ මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා යෝජිත ප්‍රතිපත්ති පදනම් කරගත් ණය වැඩසටහන සඳහා නිරීක්ෂණ සහ අදහස් දැක්වීම.
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත සහ රාජ්‍ය ණය කළමනාකරණ පනත කෙටුම්පත් කිරීමට සහය වීම.
- ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සම්බන්ධීකරණය කිරීම
- සාර්ව ආර්ථික පුරෝකථනය පිළිබඳව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ  ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් පවත්වන ලදී.

## 2.6 පරිසර කළමනාකරණය

මේ වනවිට ශ්‍රී ලංකාව පාරිසරික හායනය සහ දේශගුණික අභියෝග වැනි පාරිසරික අභියෝගවලට මුහුණ පා සිටී. එසේම ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස වලට  බෙහෙවින් ලක්වන හෙයින් ආර්ථික සංවර්ධනයට ද සැලකිය යුතු ලෙස බලපාන දේශගුණික විපත්තිද නිතර අත්විඳියි. දේශගුණික විපර්යාස වල අහිතකර බලපෑම් හේතුවෙන් ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් වඩාත් අවධානමට ලක්විය හැකි රටක් ලෙස හඳුනා ගෙන ඇත. මෙම ව්‍යසනයන් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතියට බාධා පමුණුවනවා පමණක් නොව අවධානමට ලක්විය හැකි ප්‍රජාවට දුෂ්කරතා ඇති කිරීමටද හේතු වේ.

පාරිසරික කළමනාකරණයට ප්‍රමුඛත්වය ලබා දීම යනු හුදෙක් පරිසර සංරක්ෂණය පිළිබඳ සැලකිලිමත් වීම පමණක් නොව එය දිගුකාලීන තිරසර සංවර්ධනය, මානව යහපැවැත්ම හා ගෝලීය සහයෝගීතාව සඳහා උපායමාර්ගික ආයෝජනයක් සඳහාද මූලික වේ.

දේශගුණික විපර්යාස අවම කිරීම සහ අනුවර්තනය වීම, වනජීවී හා වනාන්තර සංරක්ෂණය, අපද්‍රව්‍ය කළමනාකරණය, ප්ලාස්ටික් අපද්‍රව්‍ය ජනනය අවම කිරීම හා පරිසර පද්ධති සංරක්ෂණය කෙරෙහි අවධානය යොමු කරමින් පාරිසරික කළමනාකරණය කෙරෙහි ශ්‍රී ලංකා රජය ඉහල ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. තවද, කෙටුම්පත් කරන ලද බැඳුම්කර රාමුව (Green Bond Framework),  තිරසාර මූල්‍ය මාර්ග සිතියම (Sustainable Finance Roadmap) හා ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය (Green Finance Taxonomy) ඇතුළු නීල හරිත මූල්‍යකරණය සඳහා වන ශ්‍රී ලංකා රජයේ ප්‍රයත්නයන් තිරසර සංවර්ධනයට සහ ජාත්‍යන්තර බැඳීම් සපුරාලීමට ශ්‍රී ලංකාවේ කැපවීම පෙන්නුම් කරයි.

**නිම කරන ලද කාර්යයන්**

- පරිසර කළමනාකරණ අංශයට අදාළව රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 15 ක් ඇගයීමට ලක් කිරීම.
- රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 11 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.

**විශේෂ කාර්යයන්**

- පරිසර සම්පත්වල අගය ගණනය කිරීම සඳහා මාර්ගෝපදේශය - (Green Book) සැකසීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ කටයුතු කිරීම.
- සමුද්‍රීය අවකාශ සැලසුම්කරණය (Maritime Spatial Planning) වැඩසටහන සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කිරීම.
- ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගීතාවයෙන් දකුණු ආසියාවේ තිරසර දේශගුණික හා ආපදා අවධානමට ඔරොත්තු දෙන සහ අඩු කාබන් සංවර්ධනය පිළිබඳ වැඩසටහනට අදාළ වැඩමුළු සම්බන්ධීකරණය කිරීම
- පරිසර කළමනාකරණ අංශයේ ව්‍යාපෘතීන් ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීම.
- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම.
- පරිසර අංශයට සම්බන්ධ විවිධ මෙහෙයුම් කමිටු සඳහා සහභාගී විම
- විදේශ දූත මණ්ඩල සම්බන්ධ කරුණු සඳහා නිරීක්ෂණ ලබා දීම

**ආපදා කළමනාකරණය**

ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් නිරිත දිග මෝසම් සමයේදී නිතර සිදුවන ගංවතුර හා නායයෑම්, අධික සුළං/චණ්ඩමාරුත, අකුණු සැර වැනි බහුවිධ ස්වාභාවික ආපදාවන්ගේ අහිතකර බලපෑම්වලට ලක්වේ. එක්සත් ජාතීන්ගේ ගෝලීය අවධානම් දර්ශකයට අනුව, 2022 වසරේදී ශ්‍රී ලංකාව ලෝකය පුරා රටවල් 185ක් අතරින් 104 වන ස්ථානය වාර්තා කර ඇත. තවද, 2021 දේශගුණික අවධානම් දර්ශකයට අනුව, ශ්‍රී ලංකාව රටවල් 180ක් අතරින් 30 වන ස්ථානයට පත්ව ඇත.

ස්වභාවික අපදා හේතුවෙන් පසුගිය වසර වල දී, මිනිස් ජනාවාස විනාශ කරමින් සහ දේපල හානි සිදුකරමින් සැලකිය යුතු මිනිස් මරණ සංඛ්‍යාවක් වාර්තා වී ඇත. උදාහරණයක් ලෙස, 2023 වසරේදී, ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 14ක ගංවතුර සහ නායයෑම් මගින් ආසන්න වශයෙන් 200,000කට වැඩි පිරිසක් පීඩාවට පත්විය. ඊට අමතරව, 2015 - 2024 කාලය තුළ, ගංවතුර සහ නායයෑම් හේතුවෙන් මිනිස් මරණ 400 කට වැඩි සංඛ්‍යාවක් වාර්තා විය. එබැවින්, රටේ සංවර්ධන ගමන් මඟට අනුකූලව ආපදා අවධානම් අවම කිරීම සඳහා උපායමාර්ගික විසඳුම් ඇතුළත් කළ යුතු බව පසක් වේ.

තවද, ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඇති කරමින් රටේ දිස්ත්‍රික්ක 13ක් නායයෑම් සහ ගංවතුර වලට ලක්විය හැකි තත්ත්වයක පවතී. (මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 30ක් සහ රටේ ජනගහනයෙන් සියයට 38ක් නියෝජනය කරමින්) මෙ හේතුවෙන්, රට වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 40 සිට 75 දක්වා ආර්ථික පාඩුවකට මුහුණ දෙයි. තවද, රටේ පවතින ප්‍රතිපත්ති රාමුව සහ සෙන්දායි රාමුව (Sendai Framework) වැනි ජාත්‍යන්තර වගකීම් වලට අනුකූලව, ආපදා අවධානම වටහා ගැනීම, ආපදා අවධානම් පාලනය ශක්තිමත් කිරීම තුළින් ස්වභාව ධර්මය හෝ මිනිසා විසින් ඇති කරන ලද හෝ පාරිසරික, තාක්‍ෂණික හා ජීව විද්‍යාත්මක ගැටලු හේතුවෙන් ඇති වන අවධානම් සෑම ආකාරයකින්ම අඩු කිරීමට අපේක්‍ෂා කරන අතර, ඒ හරහා ආපදා අවධානම අඩු කිරීම සඳහා ආයෝජනය කිරීම, ඵලදායි ප්‍රතිචාර දැක්වීම සඳහා ආපදා සූදානම වර්ධනය කිරීම සහ ප්‍රතිසාධනය, පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කෙරේ.

**නිම කරන ලද කාර්යයන්**

- ආපදා කළමනාකරණ අංශයට අදාළව ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය විසින් යොමු කරන ලද ව්‍යාපෘති යොජනා 06 ක් ඇගයීමට ලක් කිරීම.
- ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියේ (Project submission format)14 වන කොටස (ආපදා අවධානම අවම කිරීම) සඳහා මාර්ගෝපදේශ අත්පොත සකස් කිරීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය (JICA) සමඟ එක්ව කටයුතු කිරීම.

- ආපදා කළමනාකරණ අංශයේ ව්‍යාපෘතීන් ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීම.
- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම.
- ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ නියෝජිතායතනවලට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
- විදේශ දූතමණ්ඩල සම්බන්ධ කරුණු සඳහා නිරීක්ෂණ ලබා දීම.

## 2.7 සමාජ ආරක්ෂණ

**සමාජ ආරක්ෂණ අංශය**

සමාජයේ ජීවත්වන වන වරප්‍රසාද නොලත් අත්‍යවශ්‍ය සියලුම ජන කොටස් සඳහා ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවමින් සහ සවිබල ගැන්වීම් මඟින් රටේ සංවර්ධන ප්‍රවේශයට අනුගත කිරීම සඳහා ඉලක්ක කර ගත් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම රැසක් රජය ක්‍රියාත්මක කරනු ලබයි. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය, ළමුන්, අවාසි සහගත කාන්තාවන්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයින් ඇතුළු අවධානමට ලක්විය හැකි කොටස්වල යහපැවැත්ම සහතික කිරීම සඳහා වගකිව යුතු ප්‍රධාන අමාත්‍යාංශ වේ. ඒ අනුව මෙම කණ්ඩායම්වල ජීවන තත්ත්වය නඟා සිටුවීමට සහ ඔවුන් සමාජයට ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව රේඛීය අමාත්‍යාංශ සමඟ අවශ්‍ය මැදිහත්වීම් සිදු කරයි.

**2024.12.31 දිනට ප්‍රගතිය**

- **ව්‍යාපෘති යෝජනා සඳහා ඇගයුම් වාර්තා සකස් කිරීම සහ කැබිනට් පත්‍රිකා වෙත නිරීක්ෂණ සකස් කිරීම**

| | ලැබුණු සංඛ්‍යාව | නිර්දේශිත/ ඉදිරිපත් කළ සංඛ්‍යාව |
|---|---|---|
| ව්‍යාපෘති යෝජනා | 05 | 05 |
| කැබිනට් සංදේශය සඳහා නිරීක්ෂණ | 03 | 03 |
| කැබිනට් සංදේශය සඳහා අදහස් | 04 | 04 |

- **ජාතික ප්‍රතිපත්ති සැකසීම -** ශ්‍රී ලංකාව සඳහා ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය සකස් කර එළිදක්වන ලදී.
- **පහත වාර්තා පිළිබඳ අදහස් ලබා දෙන ලදී;**
  - ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩතාවයෙහි වින්දිත කාන්තා රැකවරණ නිවාස කළමණාකරණ මාර්ගෝපදේශය
  - ශ්‍රී ලංකාවේ ලිංගික ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) ආමන්ත්‍රණය
  - කිරීම සඳහා බහු ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කිරීම 2024-2028
  - SDG 16 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම – 2024 පෙබරවාරි 26 – සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන පිළිබඳ SDG 16 පිළිබඳ UNDP ශ්‍රී ලංකා ප්‍රමුඛ සාකච්ඡා
  - මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පස් අවුරුදු බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම (2024-2028)
  - කාන්තා මූල්‍ය හුවමාරුව සඳහා තාක්ෂණික සහාය (gWFX)

- උප ව්‍යාපෘතිය 1: කාන්තා මූල්‍ය වෙළඳපොළ සැලසුම් කිරීම, සැකසීම සහ නඩත්තු කිරීම
- ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය පිළිබඳ පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2024-2028

- **රැස්වීම් සහ වැඩමුළු වලදී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව නියෝජනය කරයි -**

  - සමාජ ආරක්ෂණ අංශයේ අදාළ රේඛීය ආයතන විසින් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට සහභාගී වූ අතර සමාජ ආරක්ෂණ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය යෙදවුම් සපයන ලදී.

**ශ්‍රමික අංශය**

භාණ්ඩයක් හෝ සේවාවක් වෙළඳපොළට ගෙන ඒම සඳහා පුද්ගලයෙකු විසින් කායික හා මානසික වශයෙන් දරන උත්සාහය නොහොත් ශ්‍රමය, නිෂ්පාදනයේ ඉතාම වැදගත් සාධකයක් වේ. ශ්‍රමය පිළිබඳ සැලකීමේදී, පුද්ගලයාගේ කුසලතා මට්ටම, අධ්‍යාපනය සහ ඵලදායිතාව කෙරෙහි ඇති උනන්දුව ඇදහිය නොහැකි තරම් වැදගත් අංග වේ. එබැවින් ආර්ථිකයේ සමස්ත ඵලදායිතාව ශ්‍රමයේ ගුණාත්මකභාවය මත රඳා පවතී. ශ්‍රී ලංකාවේ "පොහොසත් රටක් ලස්සන ජීවිතයක් " යන ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව සෑම තරාතිරමකම සේවකයින් සඳහා සමානාත්මතාවය සහ පිළිගැනීම සහතික කිරීම අරමුණු කරගනිමින්, කුසලතාවෙන් හෙබි ඵලදායී ශ්‍රම බලකායක් බිහිකිරීම අත්‍යවශ්‍ය වේ. ආර්ථිකයේ සීඝ්‍රවත් වර්ධනයක් අත්කර ගැනීමට හා ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණය, දැනුම සහ කුසලතාව පදනම් කරගත් ශ්‍රම බලකායක් අප රට තුල ස්ථාපිත කළ යුතුය. තවද තාක්ෂණය, දැනුම සහ කුසලතාවලින් පිරිපුන් ශ්‍රමිකයන් රැකියා සඳහා විදෙස්ගත කිරීම තුලින් රටේ පවතින වත්මන් ආර්ථික අර්බුදයට සාධනීය පිළියමක් ලබා ගැනීමට හැකිවනු ඇත. මේ තුළින් විදේශ විනිමය අර්බුදය සඳහා කෙටි කාලීන විසඳුමක් සැපයෙන අතර දීර්ඝ කාලීනව ඉහළ අත්දැකීම් සහ ව්‍යවසායකත්ව හැකියාවන්ගෙන් සමන්විත දක්ෂ ශ්‍රම බලකායක් මෙරට වර්ධනය වේ. විදේශ රැකියා ප්‍රවර්ධනය තුලින් විගමනික ප්‍රේෂණ වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් සිටී.

ශ්‍රමික අංශය, කම්කරු අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ප්‍රතිපත්ති සම්පාදනයට  සහායවීම, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබාදීම හා ජාතික/ආංශික සංවර්ධන සැලසුම් ඇගයීම සඳහා දායකත්වය ලබා දේ. ඒ අනුව ශ්‍රමික අංශය 2024 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු අවසන් කරන ලදි.

- ව්‍යාපෘති යෝජනා දෙකක් ඇගයීම් කර අදාල දෙපාර්තමේන්තු වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇත.
- කම්කරු හා විදෙස් රැකියා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 3ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- සංවර්ධනය සහ සහයෝගීතාව සඳහා ස්විට්සර්ලන්ත නියෝජිතායතනයේ සහය ඇතිව මුදල් අමාත්‍යාංශය සහ ILO අතර ගිවිසුමක ප්‍රතිඵලයක් ලෙස විදෙස් රැකියා විගමනිකයන් සඳහා හදිසි ඉවත් කිරීමේ ප්‍රතිචාර සැලැස්මක් සකස් කිරීමට සහයෝගය ලබා දෙමින් සිටී

## 2.8 ප්‍රාදේශීය සංවර්ධන

**ප්‍රාදේශීය සංවර්ධන අංශය**

මෙම අංශය දිළිඳුකම පිටුදැකීම, පවතින ප්‍රාදේශීය විෂමතා අවම කිරීම, ප්‍රදේශයේ සුවිශේෂත්වය හඳුනා ගැනීම සහ සමෘද්ධිමත් ගමක් හෝ ප්‍රදේශයක් ගොඩනැගීම ඉලක්ක කර ගනිමින් එක් එක් ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ක්ෂේත්‍ර විශේෂිත ප්‍රතිපත්ති ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපත්තිමය සහය මෙම අංශය විසින් ලබාදෙනු ලැබේ. එසේම, ආංශික සහ මධ්‍ය කාලීන සැලසුම්, ව්‍යාපෘති ඇගයීම සහ ව්‍යාපෘති ප්‍රමුඛතා පදනම සකස් කිරීම ආදී කටයුතු ද මෙම අංශය විසින් හසුරුවනු ලැබේ.

ඒ අනුව, ජාතික මට්ටමින් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා එක් එක් පළාතේ පවතින සම්පත් ප්‍රශස්ත සහ තිරසර ලෙස භාවිත කිරීමේ වැදගත්කම මෙම අංශය මඟින් ඉස්මතු කර දක්වයි. මෙම සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහයෝගය දේශීය අරමුදල්, විදේශ ණය සහ විදේශ ආධාර ප්‍රදාන මගින් ලබාගනු ලැබේ.

මුදල් කොමිෂන් සභාව විසින් සියලුම පළාත් සභා සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීමේදී මෙම අංශය විසින් අවශ්‍ය සහය / නිරීක්ෂණ ආදිය ලබාදෙයි.

තවද, , ප්‍රාදේශීය විෂමතා අඩු කරමින්, ජාතික සංවර්ධනය පෝෂණය කිරීම අරමුණු කරගෙන 2024 විමධ්‍යගත අයවැය වැඩසටහන නිර්මාණය කර ඇත. ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සහ රට පුරා සාධාරණ වර්ධනයක් වැඩිදියුණු කිරීම මගින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කොට ඇත.

2024 අයවැය යෝජනා මගින් විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 11,250ක් වෙන් කර ඇත. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක MF/02/2023 හා 2023.12.29 දිනැති චක්‍රලේඛය මගින් ලබා දෙන ලදී.

මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක අනුව හඳුනාගත් ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අතර, එම යෝජනා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනය කර ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලදී. ජනාධිපති ලේකම් කාර්යාලය මෙම යෝජනා අනුමත කර මුදල් නිකුත් කිරීම සිදුකර ඇත.

ඒ අනුව 2024.09.11 වන විට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 11,217 ක වටිනාකමක් සහිත ව්‍යාපෘති 33,958 ක් ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කර ඇත. ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රගති වාර්තාවට අනුව, 2024.12.31 දිනට රු. මිලියන 10,211.87 ක් වියදම් කර ඇති අතර, රුපියල් මිලියන 1.27 ක අතැති බිල්පත් පැවතිනි.

ජේ.එම්.එස්.ඩී. රත්නායක
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මහලේකම් කාර්යාලය
කොළඹ-01.

..........................................................

ප්‍ර.ග.නි./ග.නි/ආයතන ප්‍රධානි අත්සන

# 03 පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත

## 3.1 මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ-එෆ්

### 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2023 රු. | | සටහන | තත්‍ය 2024 රු. | තත්‍ය නැවත ගලපන ලද 2023 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 331,902,000 | 183,039,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 1,335,285 | 20,262,219 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 4,666,870 | 8,747,669 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **337,904,154** | **212,048,889** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **337,904,154** | **212,048,889** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 39,247 | 3,105,286 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **337,864,907** | **208,943,603** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | ඒසීඒ-2(ii) |
| 107,260,062 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 106,919,579 | 95,048,055 | ඒසීඒ-2(ii) |
| 37,421,077 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 33,573,039 | 31,040,275 | ඒසීඒ-2(ii) |
| 869,861 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 869,861 | 2,958,239,904 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| **145,551,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **141,362,479** | **3,084,328,234** | |
| | **මූලධන වියදම්** | | | | |
| 3,600,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | - | 2,147,633 | ඒසීඒ-2(ii) |
| 251,735,249 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 72,868,772 | 11,377,135 | ඒසීඒ-2(ii) |
| 3,000,425,564 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 2,611,408,343 | 12,099,207,729 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | 2,114,353,125 | ඒසීඒ-2(ii) |
| 2,000,000 | හැකියා වර්ධනය | 14 | 556,500 | 47,500 | ඒසීඒ-2(ii) |
| 1,649,711,187 | වෙනත් මූලධන වියදම් | 15 | 1,608,548,863 | 7,409,605,493 | ඒසීඒ-2(ii) |
| **4,907,472,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **4,293,382,478** | **21,636,738,615** | |
| | තැන්පතු ගෙවීම් | | 3,420,516 | 17,926,671 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 4,853,973 | 5,310,771 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **8,274,488** | **23,237,442** | |
| **5,053,023,000** | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **4,443,019,445** | **24,744,304,291** | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (4,105,154,538) | (24,535,360,688) | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | (4,105,154,538) | (24,535,360,688) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | ඒසීඒ-3 |
| | | | - | - | |

1

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඑ-පී

**2024 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඑ-6 | 134,013,060 | 131,980,342 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඑ-5/5(ඒ) | 11,857,127 | 11,670,024 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඑ-3 | - | - |
| **මුළු වත්කම්** | | **145,870,187** | **143,650,365** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 11,606,810 | 9,334,475 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 134,013,060 | 131,980,342 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඑ-5(බී) | - | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඑ-4 | 250,317 | 2,335,548 |
| අග්‍රිම ශේෂය | ඒසීඑ-3 | - | - |
| **මුළු වගකීම්** | | **145,870,187** | **143,650,365** |

පිටු අංක……….සිට ……… දක්වා ඒසීඑ 1 සිට ඒසීඑ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ………. සිට ………. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තගර්ත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාගෙර්ාපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.**

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාතර්ාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ………………….. | ………………………. | ……………………………….. |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : කේ.එම්. මහින්ද සිරිවධර්න | නම : ජේ.එම්.එස්.ඩී.රත්නායක | නම : ඩබ්.එස්.පී. ද මෙල් |
| තනතුර : ලේකම් | තනතුර : අධ්‍යක්ෂ ජනරාල් | |
| දිනය : 2025.02.18 | දිනය : 2025.02.24 | දිනය : 2025.02.24 |

කේ.එම්.මහින්ද සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය

ජේ.එම්.එස්.ඩී. රත්නායක
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මහලේකම් කාර්යාලය
කොළඹ-01

ඩබ්ලිව්.එස්.පී. ද මෙල්
ගණකාධිකාරී
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
පළමු මහල, මහලේකම් ගොඩනැගිල්ල
කොළඹ - 01

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන | 2024<br>රු. | නැවත ගලපන ලද<br>2022<br>රු. |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 2,450,182,426 | 1,489,528,269 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 6,223,144 | 5,257,944 |
| අග්‍රිම ලැබීම් | | 331,902,000 | 183,039,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 4,027,974 | 6,151,289 |
| තැන්පතු ලැබීම් | | 1,335,285 | 20,262,219 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **2,793,670,829** | **1,704,238,722** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 2,779,791,943 | 1,669,987,990 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 869,861 | 976,976 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | - | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 39,247 | 3,105,286 |
| අත්තිකාරම් ගෙවීම් | | 3,779,060 | 5,581,605 |
| තැන්පතු ගෙවීම් | | 3,420,516 | 17,926,671 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **2,787,900,628** | **1,697,578,528** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **5,770,201** | **6,660,194** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | | 5,770,201 | 6,660,194 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **5,770,201** | **6,660,194** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | | **(5,770,201)** | **(6,660,194)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | - | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | - | - |

3

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - -

**3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ**

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| - | - | - | - | - | - |

**3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය**

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 133,331,000 | 145,551,000 | 141,362,479 | 97.12 |
| ප්‍රාග්ධන | 4,248,680,000 | 4,907,472,000 | 4,293,382,478 | 87.49 |
| මුළු එකතුව | **4,382,011,000** | **5,053,023,000** | **4,434,744,956** | **87.76** |

**3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | | අදාල නොවේ | | | | |

### 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කර ණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 33,810,000.00 | | |
| 9152 | වාහන | | 56,595,763.00 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ හා අනෙකුත් | | 42,153,286.00 | | |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | 1,454,010.71 | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

### 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව -

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව ඇමුණුම 1 ලෙස දක්වා ඇත.

# 04 පරිච්ඡේදය–කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති ගණන | | 86.66% | |
| අගයන ලද ව්‍යාපෘති යෝජනා ගණන | 95.49% | | |
| සපයන ලද නිරීක්ෂණ ගණන | 100% | | |
| අගයන ලද ජාතික/ උප ජාතික සැලසුම් ගණන | 100% | | |
| නිර්දේශ කරන ලද යෝජනා ගණන (DCB) | 98.71% | | |

## 05 පරිච්ඡේදය- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස ආර්ථිකමය සහ සාමාජීය වශයෙන් වැදගත් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි අංශ 9කට සහ උප අංශ 26කට වෙන් කර ඇත.එක් එක් අංශය ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මඟින් සිදුකරනු ලබන ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු නිර්දේශවලට යටත්ව සිදු කෙරේ. ඒ අනුව, අදාළ අමාත්‍යාංශ මගින් මූලික අනුමැතිය ලබා ගැනීම සඳහා රු.මිලියන 10ට වැඩි සියළුම ව්‍යාපෘති වාර්තා අදාළ ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියට අනුව මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි. එම ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියේ සඳහන් වන 11 වන කාණ්ඩය අනුව යෝජිත ව්‍යාපෘති මගින් තිරසර සංවර්ධන අරමුණු වලට දක්වන දායකත්වය පිළිබඳව ඇගයීමට ලක් කරනු ලැබේ. ඒ අනුව, දර්ශක 244 කින්, ඉලක්ක 169 කින්සහ අරමුණු 17 කින් සමන්විත 2030 තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයට අදාළ සියළු තිරසර සංවර්ධන අරමුණු (17), ඉලක්ක සහ ප්‍රතිපත්තිමය තීරණ මෙම දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ඇගයීමේදී සලකා බලනු ලබයි.

තවද, තිරසර සංවර්ධන අරමුණු දැනටමත් ගෝලීය වශයෙන් හඳුනාගෙන ඇති අතර එම අරමුණු අපගේ සංවර්ධන ක්‍රියාදාමයට අනුගත කර ගැනීම සිදු කරයි. එබැවින්, මෙම දෙපාර්තමේන්තුවට අදලව තිරසර සංවර්ධන අරමුණු වෙනම හඳුනාගැනීමක් සිදු කරනු නොලැබේ. ඒ අනුව, රාජ්‍ය ආයෝජන සැලැස්ම , සංවර්ධන ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු 17ට අනුගත වෙමින් සකස් කරනු ලැබේ. එසේම, එක් එක් අමාත්‍යාංශ සහ ආයතන මඟින් සංවර්ධන වැඩසටහන් සහ ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීමේදී එම ආයතන සඳහා අදාළ වන තිරසර සංවර්ධන අරමුණු ඒ සඳහා අනුගත කරගැනීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම මෙම දෙපාර්තමේන්තුව මඟින් ලබා දේ.

### 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන සභාව සමඟ සහයෝගීත්වයෙන් සියළුම අමාත්‍යාංශ සම්බන්ධීකරණ යෙන් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් සිදුකරයි.

ඒ අනුව, 2024 වර්ෂයේ දී මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ විෂය පථයට අයත්වන තිරසර සංවර්ධන දර්ශකයන්ට අදාළ ඉලක්ක හඳුනා ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව මඟින් අදාළ මහා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ ජන ලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කරන ලදී. තවද එක් එක් තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් විවිධ අමාත්‍යාංශ වෙතින් සිදු කරන කාර්යයන් ඇගයීම සඳහා තිරසර සංවර්ධන සභාව මඟින් සංවිධානය කරන ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වී ප්‍රතිපත්තිමය උපදෙස් ලබා දීමට කටයුතු කරන ලදී.

## 06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 59 | 43 | 16 |
| තෘතීයික | 01 | 02 | 01 |
| ද්විතියික | 33 | 27 | 06 |
| ප්‍රාථමික | 31 | 26 | 05 |

### 06.2 ** ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සහ කාර්ය සාධනය අතර සම්බන්ධතාවය.

ජ්‍යෙෂ්ඨ මට්ටමේ පවතින මානව සම්පත් හිඟය හේතුවෙන් එක් නිලධාරියෙකුට අංශ කිහිපයක රාජකාරි ආවරණය කිරීමට සිදුවීමෙන් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු කරා ළගා වීමට කාර්යාල වේලාවෙන් බැහැරවත් රාජකාරි ඉටුකිරීමට සිදුවෙයි.

### 06.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහන රේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහන රේ ස්වභාවය (දේශීය/විද රේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| පශ්චාත් උපාධි පාඨමාලාව Master of Business Economics | 01 | අවුරුදු 01 | 375,000 | | දේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| පුහුණු වැඩමුළුව Caring for Book and Paper Collection | 01 | දින 01 | 3,000 | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම හා ගෙවීම පිළිබඳව පුහුණුව | 01 | දින 02 | 13,000 | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| රියදුරු මහතුන් සඳහා මාර්ග නීති සම්බන්ධ දැනුවත් | 09 | දින 01 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කිරීමේ වැඩසටහන | | | | | | |
| කාර්යාල කාර්ය සහයක සේවයේ පුහුණු වැඩසටහන | 06 | දින 02 | 60,000 | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| NSF Digital Library Conference 2024 | 02 | දින 01 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Sustainable regenerative and resilient rice – based food systems to strengthen community and ecosystem health in tree river basins of Sri Lanka | 01 | දින 01 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Training Course on Open -Source Geographical Information System(GIS) and Data Analysis Techniques | 19 | දින 03 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Strategic workshop on Transport & Highways | 01 | දින 01 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Workshop on Developing a TOR for the Formulation of National Strategic Plan for Water Sector | 01 | දින 02 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| 3rd NDA Readiness Support Project : Updating the Technology Need Assessment (TNA) and Technology Action Plan(TAP) –Energy Sector – 2nd stakeholder | 01 | දින 01 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Consultation Workshop | | | | | | |
| Enhancing theknowledge of disbursement policies and procedures through practical case studies | 02 | දින 02 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Young Enterpreneurs showcase | 01 | දින 01 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Training Programme on Life Cycle Assessment (LCA) | 01 | දින 02 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Workshop on " Project Planning - 2024" | 01 | දින 02 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Workshop on the Sri Lanka Stratergy for the Development of Statistics (SLSDS) | 02 | දින 01 | | | දේශීය | කෘතීම බුද්ධිය භාවිතය පිළිබඳ දැනුම වර්ධනය වීම |
| SA24.24INS-CRS Macroeconomic Foundation Course for General Inductees of Central Bank of Sri Lanka | 01 | දින 05 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Cross cutting Approaches and preconditions for Disability inclusive Development | 01 | දින 06 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Capacity Building Workshop on Implementing Article 6 of the Paris Agreement in Sri Lanka | 03 | දින 02 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Training of Trainers on Operationalizing the National Evaluation Policy | 02 | දින 03 | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම සහ ආකල්ප වැඩිදියුණු කිරීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Implementation Framework(NEPIE) | | | | | | |
| Capacity Building and Knowladge exchange Program on Project Readiness Implementation and other issues | 01 | දින 04 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| South Asia Sub-regional Economic Cooperation Program's Working Group Meeting and Senior Officials Meeting for 2024 | 01 | දින 02 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| The Project for Capacity Development for Effective Public Investment Management | 01 | දින 05 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Capacity Building and Knowladge exchange Program on Project Readiness Implementation and other issues | 06 | දින 04 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| ADB : Regional Forum on Adapting to Aging Asia and Pacific and 2024 Regional Conference on Reframing Ageing | 01 | දින 05 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| ADB : Nominations to the Third East Asia Forum | 01 | දින 02 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Sri Lanka : Public Finance Review (SL-PFR) Knowledge Exchange on Ficsal Management in Thailand | 06 | දින 04 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| The Project for Capacity Development for Effective Public Investment Management | 05 | දින 05 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| 2024 Conference on Regional Cooperation and Integration - Enhancing Critical Minerals for the Clean Energy Transition | 01 | දින 03 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Reframing Ageing - Asia Pacific Regional Conference on Population Ageing 2024 | 01 | දින 03 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Seminar on Medium to Long-Term Development Planning for Developing Countries | 03 | දින 14 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Coaliation of Finance Ministers for Climate Action (CFMCA) Regional Meeting | 01 | දින 02 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Seminar on Application and Management of PPP Mode for Sri Lanka | 01 | දින 14 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ITEC : Project and Risk Management in Government Sector | 01 | දින 19 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Visit related to the Implementation of the PM Gati Shakti Platform in Sri Lanka | 01 | දින 05 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| People, Planet, Prosperity Forum & Natural Capital Sumposium | 01 | දින 05 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| ADB : Nationally Determined Contribution Advance Regional Workshop | 01 | දින 03 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| V20 Climate Prosperity Fellowship Program 2024-2025 | 01 | දින 07 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Seminar on Addressing Climate Change and Green Development under the Global Development Initiative | 01 | දින 14 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| 2024 Global Leadership Program | 01 | දින 10 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| JICA Knowledge Co-Creation Program : Gender Mainstreaming Policies for Governament Officers | 01 | දින 09 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Seminar on China's Experience in Sustainable Social Development and Poverty reduction for Developing Countries | 01 | දින 14 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Seminar on Governance Capability for China - Belt & Road Countries | 01 | දින 14 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Seminar on Renewable Energy Power Sector Standardization Cooperation between China and South Asian Countries | 01 | දින 17 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| ADB : Climate and Disaster Risk Insurance Forum | 01 | දින 04 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| KOICA invitational Training Programme on Capacity building on Horticulture Industry in Sri Lanka | 01 | දින 14 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| WHO South - East Asia Regional Meeting on Nutrition and Climate Change | 01 | දින 03 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Invitation to Participate in Second International Conference on Resilient and Inclusive Social Protection : Investing Human Capital Development | 01 | දින 02 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Global Child Nutrition Forum 2024 | 01 | දින 04 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Seminar on Barrier free Access for Senior - Level Professionals under the beif and Road initiative | 01 | දින 14 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| AIxADB : Charting the Course for AI-powered Development across Asia and the Pacific | 01 | දින 07 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

## 07 පරිච්ඡේදය–අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | අදාල නොවේ | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම්සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අදාල නොවේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාල නොවේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | **අනුකූල වේ** | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | **අනුකූල වේ** | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | **අනුකූල වේ** | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | **අනුකූල වේ** | | |

**අවසානය.**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TPD/B/NPD/24/20/FA    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2025 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරී

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශවලින්, මූල්‍ය තත්ත්වය,මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට

ගණුන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 6 ඡේදයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන ඍජු ක්‍රමය භාවිතා කරමින් පිළියෙල කලයුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් මුදලින් ලද අත්තිකාරම් ලැබීම් සහ මුදලින් කල අත්තිකාරම් ගෙවීම් පමණක් සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර තිබුණි. ඒ අනුව අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් රු.1,074,913 ක් බැගින් අඩුවෙන් දක්වා තිබූ අතර එම හේතුවෙන්, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**1.6.2** එලදායි රාජ්‍ය ආයෝජන කළමනාකරණය සඳහා ධාරිතා සංවර්ධන ව්‍යාපෘතියේ Completion of Milestone of Information System for Project Proposals සඳහා ගිවිසුම් ප්‍රකාරව කාර්යය නිම කිරීම සම්බන්ධයෙන් තහවුරු කර ගැනීමකින් තොරව, 2024 දෙසැම්බර් 19 දිනැති ප්‍රධාන උපදේශකගේ (JICA ආයතනය) අභ්‍යන්තර මෙමෝ පත්‍රිකාව හා Millenium ITESP (Private) Limited ආයතනයේ ඉන්වොයිසිය පදනම් කරගෙන රු.1,454,011 ක් ගෙවීම සිදු කර ඇති ආකාරයට චෙක්පතක් ලියා තිබුණි. අනතුරුව, ප්‍රධාන උපදේශක විසින් කාර්යය නිම වී නොමැති බැවින් ගෙවීම තාවකාලිකව නවතා තබන ලෙස දන්වා තිබූ අතර 2024 දෙසැම්බර් හා 2025 ජනවාරි මස බැංකු සැසඳුම් විස්තරය අනුව මෙම චෙක්පත නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල චෙක්පතක් ලෙස දක්වා තිබුණද, එම චෙක්පත අදාල ආයතනයට නිකුත් කිරීමකින් තොරව 2025 පෙබරවාරි මස 13 දින තෙක් රඳවාගෙන තිබුණි. ඒ අනුව සත්‍ය වශයෙන් නොදරන ලද රු.1,454,011 ක වියදමක් (ගෙවීමක්) දරන ලද වියදමක් ලෙස හිතාමතා වාර්තාකර, කාලච්ඡේදය අවසානයේදී දෙපාර්තමේන්තුව තුළ වියදම් නොවී ඉතිරිව පැවැති මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය නොකර අනීතිකව රඳවාගෙන තිබූ අතර, එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වියදම හා මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව,

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 334.08 ක අග්‍රිම ඉල්ලුම් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම රු.මිලියන 353.90 ඉල්ලුම් කර රු. මිලියන 331.90 අග්‍රිම ලැබී තිබුණි. ඒ අනුව, දෙපාර්තමේන්තුව සැලැසුම් කරන අග්‍රිමයට වඩා රු.මිලියන 19.82 වැඩියෙන් අග්‍රිම ඉල්ලුම් කර තිබුණි.

### 3.2 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයයන් තුනක් හා එක් මූලධන වැය විෂයයකට අදාල ඇස්තමේන්තුගත ප්‍රතිපාදන එකතුව රු.6,050,000 න් රු.3,503,826 ඉතිරිව තිබූ අතර එම ඉතිරිය සියයට 33 ත් සියයට 72 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

(ආ) 237-1-1-2103 වැය විෂයයට අදාල ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වු රු.1,200,000 න් මු.රෙ 66 මඟින් රු.46,563 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයකට මාරු කල පසු ද රු.981,747ක් වැය නොකර ඉතිරි වී තිබුණු අතර එය එම වැය විෂයයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 85 ක් විය.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 03කට අදාළව එකතුව රු.3,600,000 සම්පූර්ණ ඇස්තමේන්තු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරිව තිබුණි.

(ඈ) මූලික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබු එක් පුනරාවර්තන වැය විෂයයක් හා එක් මූලධන වැය විෂයයක් සඳහා එකතුව රු. 11,077,872 ක් මු.රෙ 66 මඟින් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.

## 3.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති රෙගුලාසි හා කළමනාකරන තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| යොමුව | නිරීක්ෂණය |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) මු.රෙ 880,881, | ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තබා නොතිබුණි. |
| (ආ) මු.රෙ 892 | ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාවක් සෑම වර්ෂ තුනක් අවසානයේදී පසුව යෙදෙන පෙබරවාරි 15 වැනි දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අදාල වාර්තාවක් මේ දක්වා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) මු.රෙ 891(i) | ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ නම් ඇතුළත් ඇප ලේඛණයක්, එක් එක් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යාලයේ වඩාත් මැනවින් වූ ආකාරාදි ක්‍රමයට පිළියල කොට පවත්වාගෙන යා යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් මාර්ගෝපදේශයේ දැක්වෙන ආකෘතිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද

ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කළ යුතු වගකීම් ක්ෂේත්‍රය හා ක්‍රියාකාරකම් දක්වා තිබුණ ද, ඒ සඳහා වගකිවයුතු නිලධාරියා පිළිබඳව සඳහන් කර නොතිබුණි. මාර්ගෝපදේශයේ 3 (ඊ) ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම තුළ අභ්‍යන්තර විගණන සැලැස්ම අන්තර්ගත කර නොතිබුණි.

**4.2 විදේශ ආධාර ව්‍යාපෘති**

(අ) මූලික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා නොගෙන ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසංවිධාන හදිසි ආධාර ව්‍යාපෘතිය සහ ශ්‍රී ලංකාවේ වෙළඳපල සංධානය (PALAM/A) යන ව්‍යාපෘති 02ක යටතේ වැය විෂයයන් 06ක් සඳහා එකතුව රු.2,330,064,097ක් සමාලෝචිත වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ 66 මඟින් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරනු ලබන ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා මූල්‍ය අංශ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (ඕස්ට්‍රේලියානු ප්‍රදානය), වෙළඳාමේ ජාතික ආදායම්, වියදම් ක්‍රියාකාරකම්වල ඉක්මන් ප්‍රතිඵල සඳහා සහයෝගීතාවය පිළිබඳ ව්‍යාපෘතිය සහ ඵලදායි රාජ්‍ය ආයෝජන කළමනාකරණය සඳහා ධාරිතා සංවර්ධනය යන ව්‍යාපෘතීන් හතර සඳහා වෙන් කරන ලද, ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවල එකතුව රු.2,967,780,000 කින් එකතුව රු.2,282,783,809 ක් එම ව්‍යාපෘතිවල වැය විෂයයන් සඳහා භාවිතයට නොගෙන වෙනත් වැය විෂයයන් සඳහා මු.රෙ 66 මඟින් මාරු කර තිබුණි. එම මාරු කරන ලද වටිනාකම වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 08ක සිට සියයට 100ක පරාසයක පැවතුණි.

(ඇ) ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතියේ වැය විෂයයන් 03 අදාලව එකතුව රු.1,870,000,000 ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් මු.රෙ 66 මඟින් වෙනත් වැය විෂයයකට ප්‍රතිපාදන මාරු කල පසුද එකතුව රු.369,188,319 ක් ඉතිරි වී තිබුණි. එය එම වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 83 සිට 98 දක්වා පරාසයක පැවතුණි.

(ඈ) ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ 237-1-1-20-2202-13 හා 237-1-1-20-2202-17 (සංවර්ධන සහායන්) යන වැය විෂයයන් 2 සඳහා සමාලෝචිත වර්ෂයේදි වෙන් කරන ලද ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ එකතුව රු.420,000,000 න් එකතුව රු.197,695,768 ක් උපයෝජනය කිරීමෙන් තොරව ඉතුරු වී

තිබුණු අතර එම ඉතිරිය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 45 ක් හා සියයට 95 ක්ව පැවතුණි.

### 4.3 ප්‍රසම්පාදනයන්

රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථිත්ව ලියාපදිංචිය, සම්බන්ධීකරණ නිලධාරීන් ලියාපදිංචිය, සැපයුම්කරුවන් ලියාපදිංචිය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රසිද්ධ කිරීම, මිල සැඳහුම් ක්‍රමයට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීම ආදී කටයුතු, සියලු රාජ්‍ය ආයතන විසින් සිදු කළ යුතු බව දක්වා තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේදී අවස්ථා 8 ක දී එකතුව රු.2,751,980 ක් වූ ප්‍රසම්පාදන අයිතමයන් සඳහා විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීමෙන් තොරව මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.

### 4.4 වත්කම් කළමනාකරණය

#### 4.4.1 වාහන අලාභහානි

වාහන 3 කට අදාල අනතුරු පිලිබඳව මුදල් රෙගුලාසි 104 (1) (අ) සහ 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව නිකුත් කිරීමට දින 40 ත් දින 150 ත් අතර කාලයක් ගෙන තිබුණි. මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණයෙන් පසු අලාභ හානිය සිදු වූ දිනයේ සිට මාස 03ක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, වාහන අනතුරකට අදාලව (CAQ – 8772) පූර්ණ වාර්තාවක් මේ දක්වා ඉදිරිපතර නොතිබූ අතර මේ පිළිබඳව මූලික පරීක්ෂණයක් හෝ පවත්වා නොතිබූ අතර අනෙත් වාහන අනතුර (WPKP-5871) සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට මාස 6 ක කාලයක් ගෙන තිබුණි.තවද, දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශයට තාවකාලික පරිහරණය සඳහා භාරදී තිබූ වාහනයක් අනතුරකට ලක්වීමට අදාලව මුදල් රෙගුලාසි 1642 ප්‍රකාරව පොලිසියට අප්‍රමාදව වාර්තා කර නොතිබූ අතර රියදුරු විසින් අදාළ බලධාරීන් වෙත වාර්තා කිරීමක් කර තිබූ බවට විගණනයේදී තහවුරු නොවීය. මෙම අනතුර සිදුවී මාස 09 කට අධික කාලයට පසු මූලික පරීක්ෂණ පැවැත්වීමට පත්කර තිබූ පරීක්ෂණ මණ්ඩලය විසින් 2024.11 29 දින 104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසාන වාර්තාවක් නිකුත් කර තිබුණ ද, එම පරීක්ෂණය මඟින් නිසි පරිදි අනතුරට අදාල කරුණු අනාවරණය වී නොමැති බවට අභ්‍යන්තර විගණනය විසින් අනාවරණය කර තිබූ බවත්, ඒ අනුව මෙම අනතුර සිදු වී මාස 19 කට අධික කාලයක් ගත වි ඇතත් පරීක්ෂණ කටයුතු අවසන්වි නොමැති බව නිරීක්ෂණය විය.

## 5. තිරසර සංවර්ධනය

### 5.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනාගැනීම

එක්සත් ජාතීන්ගේ 2030 වර්ෂය දක්වා වූ න්‍යාය පත්‍රයට අනුව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම හා ඒවාට ළඟාවීම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්නායක හඳුනාගැනීම හා ඊට අදාල නිවැරදි දත්ත පද්ධතියක් ඇති කිරීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය නොවීය.

## 6. මානව සම්පත් කළමනාකරණය

විගණනයට ඉදිරිපත්කල තොරතුරු අනුව 2024 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තත්‍ය සේවක සංඛ්‍යාව 42 තුළ, රා.ප.චක්‍ර 14/2022 අනුව වසර 5 ක විදේශ නිවාඩු ලබා ගත් නිලධාරීන් දෙදෙනෙක්, සේවය හැරගියා සේ සලකනු ලබන නිලධාරීන් එක් අයෙක් සහ විධිමත් අනුමැතියකින් තොරව වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබාගත් නිලධාරියෙකුද ඇතුළත්ව තිබුණි. ඒ අනුව, සක්‍රීය සේවයේ යෙදී සිටින ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවක සංඛ්‍යාව 38 ක් විය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ කාර්යය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 21 ක් (පුරප්පාඩුව 17 සහිතව) හෙවත් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 35 කගේ දායකත්වය ලබාගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය කෙරේ. එසේ වුවද, කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු ඇතුලු පුරප්පාඩු පුරවා ගැනීමට හෝ අවශ්‍යතාවය අනුව අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව මේ දක්වා විධිමත් පියවර ගෙන නොතිබිණ.

ඩී.පී.ඒ.එස්. අනුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට